©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

✔ Published with Author Consent.

# 01 කොටස

"අක්කා තමුසෙ රෙඩිද...."

"හරි උලමෝ... යමු...."

" මෙච්චර වෙලා මොනවද ඕයි කළේ..."
" දන්නේ නැද්ද ඉතින්.... කෙල්ලො නේ....."

" අම්මේ.... ඉතින් දැන්වත් යමුද...."

" යමු යමු...."

මම එහෙම කියලා මගේ සඳුදරණීය මලනුවන් ගේ අතේ එල්ලිලා මේ යන්නේ එයාගේ බෙස්ටගේ බර්ත්ඩේ පාර්ටි එකට. එයාගෙ විතරක් නෙමේ ඉතිං... මට වඩා අවුරුද්දක් බාල වුණාට මගෙත් බෙස්ට තමා....

අපොයි කියන්න අමතක උනාතේ... මේ බෙස්ටෙක් ගැන කියන්න ගිහින් මම කවුද කියලා.... එහෙනම් ඉතින් මම ගැන මමම කියල දෙන්නම්....

මම කේෂ්මි ආශිර්නා සතරසිංහ. හාණුක සතරසිංහ ගෙයි විශ්මිකා සතරසිංහ ගෙයි ලොකු දෝණි.

ඒ දෙන්නම අද වෙනකොට අපිට පේන්නෙ නැති තැනකට අපිව දලා ගියේ මාවත් එක්කම මගේ මල්ලිවත් තනිකරලා. එතකොට මගේ මේ උලම් පැටියාගේ නම තමයි නිසිඳු සෙයාන්. හෙන හැන්ඩිය ඉතිං... අවුරුදු විසි පහයි. මට වඩා අවුරුද්දක් බාලයි. අහ් තව එකක්... අපි දෙන්නගෙම දුකට සැපට මගෝඩි වැඩ මේ ඔක්කොටම ඉන්න අපි දෙන්නගෙම බෙස්ට තමා තේව් යුගාන්. අපි තුන්දෙනා කොතැනද එතැන ලෝක විනාශෙ තමා. මොනවා කොහොම වුණත් මේ ඩබල නමට මගේ මල්ලිලා උනාට මාව නිකම් බය කරගෙන ඉන්නෙ අයියලා දෙන්නෙක් වගේ.

"මේ තමුසෙ පාර්ටි එකේදි එහෙ මෙහෙ ගිහින් ඔහු වෙන්නනම් එපා අක්කේ.... මට පේන මානේ ඉන්නවා..."
" යකූ.... හරි වැඩක්නේ.... මම තමුසෙට කියන්න ඕන එක තමුසෙ මට කියන්නේ.... මම ඔහේගෙ අක්කා උලමෝ..... නැතුව නංගි නෙමේ....."

" නමට අක්ක උනාට ඉතින් නංගිලා කරන වැඩනෙ කරන්නේ....."

මම කිව්වේ බොරුද.... මේ ගෝතරත්තේ ඉන්නේ නිකන් අයියා වගේ....මේ උලම් පැටිය විතරක් නෙමේ අනිත් රිලා පැටියත් ඉන්නේ නිකම් මගේ අයියා වගේ තමා....

වාහනේට නැග්ග වෙලාවෙ ඉඳන් කරන්නෙ මට නීති පොතක් හදන එක. මේ උලම් පැටියා ඩ්‍රයිව් කරනවට වඩා මට ඇඩ්වයිස් දෙන එක තමා කරන්නේ.... එහෙමයි කියල මේ කේම් ඔච්චට බයද....

මේ උලම් පැටියටත් රවල ගස්සල පද්දල ඔක්කොම කරල මම අහක බලාගත්තා.

" තමුසේ මට ඔහොම රැව්වට නම් වැඩක් නෑ අක්කියෝ..... දන්නවනේ තේව් ගැන... ඌ මට එහා.... මගෙන් බේරුණත් උගෙන් බේරෙන්න බෑ...."

" තමුසෙල දෙන්න නම් ඇත්තමයි මගේ වෛරක්කාරයෝ දෙන්නෙක්...."

මේ උලමා මෙච්චර මට නීති දුන්නේ මම ගැන දන්න හින්දම තමයි... තැනක් වෙලාවක් අදාළ නෑ කොහේ ගියත් මම බාල්දියක් පෙරල ගන්නවා... ඒ තරම් බාල්දි පෙරලගන්න මම එක්ස්පර්ට්.....

"ඔන්න ආවා...."

එහෙම කියලා මේ උලම් පැටියා කාර් එකෙන් බහින්න කලින් මං දිහා බැලුවේ තෝ නසරාණී වැඩක් කරල නම් අහුවෙන්න එපා කියන ලුක් එකෙන්... මම අහුවෙයි ඕවට.

මෝඩ පහේ හිනාවකුත් දගෙන මම කාර් එකෙන් බහිද්දිම අපි ළඟට දුවගෙන ආවේ තේව්ගෙ නංගී හෙශ්වි. අපි ආදරේට කියන්නේ මිනා කියලා... මොකද කෙල්ලගෙ නම හෙශ්වි මිනාරා.... මට වඩා අවුරුදු තුනක් බාලයි.

"අම්මෝ... සුදු අක්කි... අද ඔයාගේ ලස්සන.... ඇත්තමයි අක්කියෝ අද නම් මෙතන ඉන්න කොල්ලෝ ටික ඔයාව ඇස් වලිනුත් අනුභව කරයි වගේ...."

මගේ අතින් අල්ලන් එහෙම කියලා මිනා හැරුනේ මගේ පුස්නාම්බ දිහාට... මේක මට කින්ඩි හිනාවකුත් දලා අහක බලාගත්තා... නොදේකින් උලමා.... යකූ තමන්ගේ අක්ක මෙහෙම ලස්සනට හිටියහම කාටද ආඩම්බර.... මේ මීහරක් පැටියට නම් ඒකෙන් ගානකුත් නැහැ.

"ඇත්තමයි සුදු අයියා... අද නම් සුදු අක්කිව පරිස්සම් කරගන්න වෙයි හොඳේ.... මේ ඇවිත් ඉන්න කොල්ලෝ ටික අක්කා ව ඇස් වලිනුත් කයි... ඒකනම් මට ෂුවර්...."

මිනා එහෙම කියලා මගේ අතිනුයි උලම් පැටියගෙ අතිනුයි අල්ලගත්තා....

" ඇත්තටම මිනා... උඹට නම් පිස්සු මේ ගොන් ගහ දිහා අන්ධ මනුස්සයෙක්වත් බලන්නෑ.... පේන්නෙ නැද්ද අපායට ගහපු කැලැන්ඩරේ වගේ ඉන්න කැත...."

මේ උලව් පැටියා මිනාගෙ ඔලුවටත් ටොක්කක් ඇනලා මටත් කින්ඩියට හිනා වෙලා ගේ ඇතුළට ගියා... ඒත් එක්කම එළියට ආවේ තේව්ගෙ අම්මයි අප්පච්චියි.

" බලන්නකො අම්මී.... සුදු අක්කිගෙ ලස්සන අද....

" ඒකනෙ චූටි දූ.... ඇස්වහක් නම් වදින්න එපා මගේ මැණිකට..."

එහෙම කියලා නිශා අම්මි මාව තුරුල් කරගත්තා... ඔව් ඔව් තේව්ගෙයි මිනාගෙයි අම්මිටයි අප්පච්චිටයි මමයි අපේ උලම් පැටියයි කතා කරන්නේ නිශා අම්මියි අප්පච්චියි කියලා... නිශා අම්මිගෙ නම නිශාන්ති එතකොට අප්පච්චිගෙ නම ජයනාත්.

මීට අවුරුදු දෙකකට කලින් මට අවුරුදු විසි හතරෙදීත් මගේ උලම් පැටියට අවුරුදු විසි තුනේදිත් අපේ අම්මියි තාත්තියි අපිව දාලා ගියාට පස්සේ අම්මිගෙ වගේම තාත්තිගෙ නෑයො අපිට කාලකන්නි ළමයි කියලා අපිව අතෑරලා දැම්මේ අපිව අනාත ළමයි ගානට දාලා... ඒත් ඉතිං එදා ඉඳන්ම අම්මිගෙයි තාත්තිගෙයි හොඳම යාළුවො වුණ නිශා අම්මියි අප්පච්චියි මේ වෙනකන් මාවවත් මල්ලිවත් තනි කරේ නම් නෑ... තාත්ති අම්මියි මැරුනට පස්සේ තාත්තිගේ බිස්නස් වලට ඇහැ ගහගෙන හිටිය අපේ බාප්පා අපිව අතෑරියට අපේ තාත්තිගෙ බිස්නස් නම් එයාලා කීයටවත් අතාරින්න හිත හදාගෙන හිටියේ නෑ...

ඒ තරම්ම ඒවට කෙල පෙර පෙරා තමා හිටියේ... ඒත් අප්පච්චි අපි දෙන්නට තාත්තිගෙ බිස්නස් ටික අරන් දීලා මේ වෙනකන් අපි දෙන්න පස්සෙන් හෙවනැල්ලක් වගේ හිටියා...

මම පාවෙවී හිටිය කල්පනා ලෝකෙන් බිමට වැටුනේ අප්පච්චිගෙ කටහඬට

" හරි හරි යමු ..... කේක් කපන්න වෙලාව හරි සුදූ දූ...."

" අම්මෝ... ඔව්... නැත්නං ඉතින් අර ගෑස් ටැංකිය මෙතන පුපුරලා මල විජ්ජුම්බරයක් වෙනවා...."

මම එහෙම කිව්වේ අර රීලා මොටාගෙ මූණ මතක් කර කර...

" අම්මෝ පුතේ ඔව්.... යමු යමු...."

නිශා අම්මි එහෙම කියලා මාවයි මිනාවයි එක්කගෙන ගේ ඇතුලට ගියා. මම ඉතින් කෙලින්ම ගියේ අපේ බර්ත්ඩේ බෝයි මගේ රීලා පැටිය ළඟට.... අප්පේ ඉතිං අපරාදෙ කියන්න බෑ කොල්ලා හෙන හැන්ඩියා.... මෙන්න බොලේ මේ රීලා පැටියා කටත් ඇරගෙන මං දිහා බලාගෙන ඉන්නවා....

"මේ... කට වහගනින් බං... බ්‍රේක් නැති මැස්සෙක් යයි කටට.... මේ මම ලස්සනයි නේ..... ඒකනෙ කට ඇරගෙන බලාගෙන හිටියේ...."

මම ඇහැක් ගහලා බෙල්ල උස්සල රීලා පැටියට එහෙම කිව්වෙ මේ දිගන්චිය මට වඩා උස හින්ද

" නෑ.... කවුද කිව්වේ තමුසේ ලස්සනයි කියලා.... මම මේ බැලුවේ කවුද මේ අපායෙන් ඇවිත් ඉන්න මල යක්ශනී කියලා....."

මේ රීලවා මගේ කන් ලඟට පාත් වෙලා කිව්ව දේටනම් අම්මපා බොගෙ බර්ත්ඩේ එක නොවුනනම් දනියි මම කරන දේ....මෝඩ රීලවටත් රවල ගිහින් මම නිශා අම්මිගෙ අතේ එල්ලුණා...

" මොකෝ සුදු දූ.... මේ කොල්ල කියන්නේ...."

මට තරහ ගිහින් කියල නිශා අම්මිට තේරුන හින්ද තමා නිශා අම්මි එහෙම ඇහුවේ...

" බලන්න නිශා අම්මී.... මේ රීලව මට යක්ෂනීලු.... බලන්නකෝ සුරංගනාවියක් වගේ ඉන්න ඔයාගේ සුදු දූවට මේ රීලා මොටා කියන කතා...."

මම එහෙම කිව්වේ මගේ දිහා බලන් ඉන්න රීලවටයි

උලමටයි දෙන්නටම රවලා.... වෙන කවුද ඉතින් මගේ නසරානි මලයණ්ඩි ල දෙන්නට තමයි මං මේ රිලවයි උලමයි කියන්නේ.....

මටත් හිනා වෙවී රිල පැටියා කේක් කපන්න ගත්තා... කොහොම කොහොම හරි නිශා අම්මිටයි අප්පච්චිටයි මිනාටයි අපේ උලම් පැටියටයි කේක් කවල ඉවර වෙලා මේ රිලා පැටියා මගේ ලඟට ආවෙ මට කේක් කවන්න.... දෙන්නම් බොට වැඩේ කියලා මට කවපු කේක් කෑල්ල අරගෙන මම මේ රිලා පැටියගෙ මූණෙ කේක් කෑල්ලෙ අයිසින් ටික ගෑවා.... හැරෙන තැපෑලෙන් මටත් රිටන් එක දෙනවා කියලා දන්න හින්දම මම අප්පච්චි ලගට දුවන්න හැදුවා... මොන.... මගෙ අත අහු වුණේ නැතෑ ඒ රිලා මොටා ගේ අතට... දැං ඉතින් බේරෙනවා බොරූ... මගේ අත අල්ල ගත්ත ගමන් ලොකු අයිසින් තට්ටුවක් මගෙ මූණෙ ගෑවා.... මදැයි කොලා......

"ඕයි රිලා මොටෝ... මම ටිකයි ගෑවේ.... මේ බලනවා කේක් එකම මගේ මූණෙ නේ....

"කරන්න දෙයක් නෑ සුද්දී.. රිටන් එක සැරයි හොඳේ.....

" මොකක්ද චූටි පුතා මේ කරේ ... පව් මේ කෙල්ල...."

"අම්මිටත් ඉතින් පව් මේ මොන්ගලේ විතරයි.... මාව පේන්නේ නෑ....."

"හරි හරි දැන් දෙන්නත් එක්කම ගිහින් ඔය අයිසින් හෝදගෙන එන්නකෝ....."

නිශා අම්මි එහෙම කිව්වට පස්සේ මම මේ රීල පැටියත් එක්ක ගියෙ මට හිනා වෙවී හිටිය අනිත් උලම් පැටියටයි මිනාටයි රවල.පාර්ට් එකට ඇවිත් හිටිය අනිත් අයත් හිටියෙ මේ රීලා පැටියගෙයි මගෙයි වැඩ වලට හිනා වෙවී....

මම කෙලින්ම ගියෙ මගෙ රූම් එකට. ඔව් ඉතින් මේ ගෙදර අපේ ගෙදර නොවුනට මේ ගෙදරත් තියෙනවා මටයි මල්ලිටයි වෙන වෙනම රූම්. මම මගේ රූම් එකේ වොශ් රූම් එකෙන් එලියට එද්දි ඇඳ උඩ වාඩි වෙලා හිටියෙ අපේ රීලා පැටියා....

" මොකද මගෙ දිහා කන්න වගේ බලන් ඉන්නේ රීලවෝ....මගෙ මූණෙ කේක් නෑ දැන් කන්න....."

මම මේ රීලවටත් රවලා ටවල් එක ටවල් රැක් එකෙන් දාලා කණ්ණාඩිය ඉස්සසරහට ගියා...

" තමුසෙ අද හරි ලස්සනයි සුද්දි....."

මේ රීලා පැටිය මගේ පිටිපස්සෙන් ඇවිත් මගේ බෙල්ල බදාගෙන එහෙම කිව්වේ මට කිස් එකකුත් දීලා...

මම ඇස් දෙකත් චූටි කරලා බැලුවෙ මේ රීලා පැටියා මොකාටද මේ එන්නෙ කියලා..... මේ රීලා පැටියා මට බටර් ගානවත්ද කියලා දන්නේ නෑනේ... කෝකටත් ඉතින් මං බැලුවේ.... කියන්න බෑනේ..... මට මොන බාල්දියක් පෙරලන්න යනවද කියලා..... මගෙම මල්ලිලනෙ මේ........

## 02 කොටස

අවුලක් නෑ.... තේව් කොල්ල ඇත්ත තමා කියල තියෙන්නේ.....

"හෝව්....හෝව්.... එහෙනම් තමුන් මොකද මට යක්ෂණී කිව්වෙ..... අහ් "

මට යක්ෂණී කිව්ව එක මතක් වෙලා.... මන් ඉතින් යක්ෂණීගෙම වර්ශන් එකක් මූණට එන්ටර් කරගෙන තේව්ගෙ පැත්තට හැරිල ඇහුවෙ මූණට ඇගිල්ලක් දික් කරලා.....

"ඔයාව චුට්ටක් විතර අවුස්සන්න නේ බන්.... ඇත්තටම හරි ලස්සනයි සුද්දි"

මේ රීලා පැටිය එහෙම කිව්වමනම් ඉතින් මාත් මගේ චූටි

කොලු පැටියට කම්මුලට කිස් එකක් දුන්නා. ඒ ගමන මෙන්න මේකා කටත් ඇරගෙන මගේ දිහා බලාගෙන ඉන්නවා.... ඒ ගමන මොනව දැකලද මේ.

"ඒ.... රීලා මොටා මොකෝ මේ....."

"ගොඩ කාලෙකින් තමුසෙගෙන් කිස් එකක් හම්බුනේ සුද්දී..... මත් තමුසෙට දුන්නට තමුසෙ මට දෙන්නෙ නෑනේ....."

"හෑ....."

මත් ඇඟිල්ලක් කටේ ගහගෙන කල්පනා කරේ මේ මෝඩයට මත් කිස් එකක් දීලම නැද්ද කියලා...... අනේ මන්ද අප්පා..... මේ රීලා පැටියා හින්ද මගෙ ට්‍රැක් අවුට් ගතිය තවත් අවුට් යනවා.....

"මෙන්න මෙහෙ එනව යන්න.... තමුසෙගෙ කෝලම් බල බල හිටියොත් මටත් පිස්සු හැදෙනවා...... "

කටේ ඇඟිල්ලක් ඔබාගෙන හිටිය මාව අදින ගමන් මේ මෝඩය මට කිව්වෙ තව පොඩ්ඩෙන් හතර ගාතෙ දල මත් වැටෙන්න යද්දි...

" ඇයි යකූ..... මමයෑ මෙතන පදිංචි වුණේ..... තමුසෙනේ..... මෙතන ඇවිල්ල මාවත් මොන්ගෝලියානු

කරවන්නේ..."

"කට නම් තියෙනව තමුසෙගෙ වක්කඩේ වගේ. ඒ වුණාට දෙඩම් ගෙඩියක් තරම් උස නෑ."

"අනේ මේ..... මගෙ උස ගැන මම බලාගන්නම්කෝ... දැන් අපි පහලට යමුද දිගංචියෝ..."

මන් ඉතිං තේව්ගෙ අතේ එල්ලිලා රූම් එකෙන් එලියට ආවෙ පහලට යන්න. අපි දෙන්න එන විදිහට පහල හිටිය හැමෝම බලාගෙන හිටියෙ නිකන් කපල් එකක් එන දිහා බලාගෙන ඉන්නව වගේ.... අපි දෙන්නට ඉතිං ඒක හොඳටම තේරුන හින්ද අපි දෙන්නත් දන්න හොඳම කෝලම් දදා පහලට ආව.

"අම්මපා මේ දෙන්නනම් තාමත් පොඩිඋන් වගේනෙ ඇත්තමයි..."
අපි දෙන්න ලගට ඇවිත් නිශා අම්මි එහෙම කිව්වට පස්සෙ මම එයාගෙ මූණ බදාගෙන කිස් එකක් දුන්නා.

නිශා අම්මි මගෙ මූණ අතගාල ගියෙ ආව හිටිය අයත් එක්ක කතා කරන්න. තේව් අපේ මල්ලි එක්ක යද්දි මම මිනාව හෙව්වෙ කෙල්ල කොහෙද කියලා. එයත් එයාගෙ යාලුවොත් එක්ක කැකිරි පලනව එකසිය ගානට. මාත් ඉතිං එලියට ගියා. මෙතන ඇවිත් ඉන්න බාගෙට බාගයක් මාත් අඳුරනවා.

මොකද අප්පච්චිගෙ යාලුවො වගේම ඒ අය අපේ තාත්තිගෙත් යාලුවො. මාත් ඉතිං ආව අය එක්ක කතා කර කර හිටියා. මත් කොහෙ හිටියත් මල්ලිගෙ වගේම තේවිගෙ ඇස් දෙකත් මගෙන් ඈත් වුණේ නෑ. ඇයි ඉතිං මත් බකට් පෙරලගන්න එක්ස්පර්ට් කියල ඒ දෙන්නම දන්නවනේ.

රෑ දෙළහ විතර වෙද්දි පාර්ටියත් ඉවර වෙලා කට්ටියම නිදා ගන්න ගියා. මමත් ඉතිං වොශ් එකක් දාගෙන ඇඳුමකුත් දාගත්තෙ නිදා ගන්න කියලා. මේ ගෙදරත් හරියට මගෙ ගෙදර වගේම නිසා මගෙ ඇඳුම් පවා මෙහෙ තියෙනවා.

මට මහන්සියට නින්ද යාගෙන එද්දිම කව්රුහරි ඇඳ ළඟට එනව කියල තේරුණ හින්ද මත් ඇස් ඇරිය.ඒ වෙලේ තමා මතක් වුනේ මත් දොර ලොක් කරල නෙමේ නිදාගන්න ආවෙ කියලා. මේ වෙලාවට තමා ඉතිං නැති හොල්මනුත් මතක් වෙන්නේ....

වෙලාවට ඇඳ ලඟ තිබ්බ ටේබල් ලැම්ප් එකේ එළියෙන් ඒ ආවෙ තේවි කියල අඳුරගත්ත. වෙලාවට දුර ඉඳලම අඳුරගත්තේ.... නැත්තන් ඉතිං මෙලහකට මම මෙතන දහ අට සන්නියම නටනවා.... ඒ තරම්ම මම හෙන චණ්ඩියා.

" ඒ රිලා මොටෝ.... තමුසෙ මොකද මේ යක්කු ගස් නගින වෙලාවෙ මගෙ රූම් එකේ හොල්මන් කරන්නේ.....

ආහ්....... "

හිතට ආව බයට හයේ පාරක් ගහල මන් කේන්ති වර්ශන් එකක් එන්ටර් කරගත්තෙ මේ රිලා පැටිය මන් බය වුණා කියල දැනගත්තොත් ඒක මගේ මේ අහිංසක චරිතයට නිගාවක් හින්ද..... හ්ම්.....

" අනේ සුද්දී..... මගෙ ඔලුව රිදෙනව ඕයි....."

තේව් ඇඳේ ඉඳගත්තෙ එහෙම කියාගෙන. මම ඒත් එක්කම ටේබල් ලැම්ප් එකේ එලිය වැඩි කරා. එතකොට තමා මේ කොල්ලගෙ ඇස් දෙක දැක්කෙ. ඇස් රතුම රතු පාටයි. මන් දඩිබිඩි ගාල තේව් ළඟට ගිහින් නලලට අත තියල බැලුවෙ උණද කියලා. එතකොට තමා මේ රිලව ලඟින් අරක්කු ගඳ ආවෙ.

"ඒයි.... තමුසෙ බිව්වද..... ආහ්....."

මට තරහ ගිය පාර මම එහෙම ඇහුවෙ තේව්ගෙ කට දෙපැත්තෙන් තද කරල අල්ලන ගමන්මයි.

"ඌයි...... අතාරිනවකෝ...."

"ආතාරින්න නෙමේ...... කියනව මට ඇත්ත."

"බියර් ටිකක් බිව්වෙ සුද්දී....."

"බොරු කියන්න එපා තමුසේ..... මට ඇත්ත කියනවා........"

" හරි හරි ඉතිං...... බිව්වා..... ඒත් ටිකයි..."

"ටික හරි බිව්වනේ..... එතකොට අර උලමා...."

"ඌත් ටිකක් බිව්වා..... "

"ආහ්.. ඒකත් එහෙමද. මම බලාගන්නම්කෝ.."

මම එහෙම කියල අනිත් නාම්බට දෙකක් අමතන්න යන්න හදද්දි තේව් මගෙ අතින් අල්ලගෙන ඔලුව දෙපැත්තට වැනුවෙ යන්න එපා කියලා.... කොච්චර හිතේ තරහ තිබ්බත් මේ රිලා පැටියගෙ මූණ දැක්කහම නම් මේ මෝඩයො දෙන්නටම බනින්න හිතෙන්නෙ නෑ.....

"සොරි සුද්දී..... ආයෙ බොන්නෙ නෑ..... ප්‍රොමිස්....."

" ඔය ඇත්තමද..... එතකොට අර උලම....."

"උට බොන්න දෙන්නෙත් නෑ....."

"හරි.... අදට විතරයි.... හැබැයි දෙන්න ආයෙ බීලා මට අහුවෙන්න එහෙම එපා.... හරිද....."

" හරි හරි බන්..... දැන් ඉදගන්නවකො ඔහොම..."

මන් ඉදගත්තට පස්සෙ මේ මැට් මෝලෙ මගෙ ඔඩොක්කුවෙ ත් ඔලුව තියාගත්තෙ මගෙ එක අතක් අරගෙන එයාගෙ ඔලුව උඩින් තියාගන්න ගමන්..... මාත් ඉතින් ඔලුව අතගෑවෙ මොනව උනත් පවුනෙ කියලා....

" හරි සනීපයි සුද්දී..... දන්නවද...... මන් හරි ආසයි ඔයා ඔහොම ඔලුව අතගානවට..... "

කොහොමත් ඉතින් මේ පිස්ස විතරක් නෙමේ.... මගෙ මල්ලිත් හරි ආසයි මට කියල ඔලුව අතගාවගන්න.....

" දන්නවද සුද්දී..... ඔයාල දෙන්න මගෙ ඇස් දෙක වගේ බන්.... උඹල දෙන්නවම මට ඕනේ..... එක්කෙනෙක්වත් නැති කරගන්න මම කැමති නෑ සුද්දී..... උඹල දෙන්නම ඉන්නෙ මගෙ පපුවෙ බන්..... ඒ තරම් ඔයාල දෙන්නට මන් ආදරෙයි..... මට බයයි උඹල දෙන්න මට නැති වෙයි කියලා...... "

මේ රිලා පැටිය ඇස් දෙකත් පියාගෙන කියවන්න ගත්ත. සැක් මගෙ ෆෝන් එකවත් ළඟ නෑනෙ මේ සීන් කෝන් එක වීඩියෝ කරගන්න. මේක වීඩියෝ කරගත්තනම් මට මාසෙකට විතර ඇති අප්පා මේ රිලා පැටියව බ්ලැක්මේල් කරන්න. මොනව කරන්නද......

ෆෝන් එකත් අතේ දුරින් නෑනේ.... අහෝ දුකකි.... ඉරකි තිතකි.....

වීඩියෝ කරන අදහස පැත්තකට දාලා මත් තේව්ගෙ ඔලුව අත ගෑවා..... එහෙම්ම මට නින්ද ගියෙ කොයි වෙලේද කියන්නවත් මම දන්නෙ නෑ.... හැබැයි උදේ ඇහැරිලා බලද්දිනම් ඒ රිලා පැටිය ඇඳේ හිටියෙ නෑ.....

එයත් හිටියෙ නැති හින්ද මම වොශ් එකකුත් දාගෙන ටවල් එක පිටින් වොශ් රූම් එකෙන් එලියට එද්දි මගෙ රූම් එක ඇතුලට තේව් ආව.

" ඒයි...... රිලා මොටෝ...... දුප් එළියට මගෙන් ගුටි නොකා...."

මාව දැකල ඇස් දෙකත් කටේ දාගෙන බය වෙලා හිටිය කොල්ලට මත් එහෙම කෑ ගහද්දි හැරෙන තැපෑලෙන්ම තේව් එලියට දිව්වා....
මම ඇඳුමකුත් දාගෙන රූම් එකෙන් එලියට එද්දි මෙන්න මේ රිලව ගල් පිලිමෙ වගේ දොර ඉස්සරහ හිටගෙන ඉන්නව. වෙන කවුරුත් නෙමේ ඉතිං මගෙ රිලා පැටිය තේව්ම තමා.....

"මේ.... අනිත් දවසෙ දොර ලොක් කරගෙන කරන මගුලක් කරගන්නවා.... ආයෙ මම නොකිව්වයි කියන්න එපා සුද්දී..... මම වෙනුවට වෙන කවුරු හරි ආවනම්

එහෙම...."

"වෙන කවුරු එන්නද මැට් මෝලේ...... අනික ඉතිං වෙන කවුරු ආවත් ඒ එන එකාටත් ඔයාට කියපු දේම තමයි පැටියෝ මම කියන්නේ....."

එහෙම කියලා මම හිනාවෙලා රිලා මොටා ගේ මූණටත් තට්ටුවක් දල ගියේ පහළට. කට්ටියම පහළ කෑම මේසේ වටවෙලා හිටියේ අපි දෙන්න එනකං. උදේටත් කාලා අපි තේව්ලගෙ ගෙදරින් ආවෙ මල්ලිට ඔෆිස් යන්න තියෙන නිසා. මාවත් ගෙදරින් දලා මල්ලි ඔෆිස් එකට ගියා.

මන් ඉතින් කම්මැලිකම යන්නත් එක්ක ෆිල්ම් බලන්න ගත්තා. එත් ඉතින් මම කොච්චර හොඳට ෆිල්ම් එක බැලුවද කිව්වොත් හීනෙත් තමයි ඒ ෆිල්ම එක බලල තියෙන්නේ. හීනෙත් බල බලා හිටිය ෆිල්ම් එක එක පාරට නැති වෙලා ගියේ මොකෙක්ද මන්ද යට් ගිරියෙන් බෙරිහන් දෙනව ඇහෙද්දි. වෙන කවුරුත් නෙමේ ඉතිං මගෙ වන් ඇන්ඩ් ඔන්ලි මලණුවන් තමා මේ බෙරිහන් දෙන්නේ.....

"අක්කේ..... එනවකො ඕයි...."

"මොකද උලමො බෙරිහන් දෙන්නේ...."

" මෙහෙ එනවකෝ....."

"ඇයි වදේ..."

මම පහලට ආවෙ මල්ලි පහල තට්ටුවෙ ඉදන් බෙරිහන් දෙන හින්දු....

"මට හෙට සිංගප්පූරු යන්න වෙනව අක්කේ....."

"ඈ..... මොකක්...... ඒ මොකටද ඒ..... "

"අර හොටෙල් එකේ ප්‍රොජෙක්ට් එකට."

"ඉතින් එයාල මෙහෙ එනව කියලනෙ තිබ්බේ..... ඇයි ඔයා යන්නේ....."

"එයාල අපිට ඉන්වයිට් කරා එහෙ එන්න.... අප්පච්චිත් යනවා....."

"කමන්නෑ චූටි..... සතියකට නේ.... බය නැතුව ගිහින් එනවා..... අප්පච්චිත් යනවනේ....."

" මම යන්න බය නෑ ඕයි...... තමුසෙව මෙහෙ තනියම දාල යන්න බෑ..... මන් එන ටිකට මෙතන මොන තොයිලයක් නටල තියෙයිද දන්නෙ නෑ.....

ඈ යකූ..... මේ උලම මාව ඒ තරමටම දෙකේ කොලේට

දුල කතා කරන්නේ....... මේක හරියන්නෙ නෑ කේම්යෝ..... බොගෙ චරිතය මේක මේ කෙලසන්නේ.....

කට පියාගෙන හිටියොත් තව මොනව කියයිද දන්නේ නෑ.....

මම ඉතින් මගෙ පුරුශ ශක්තිය එලියට අරන්..... ආ.... නෑ නෑ.... ස්ත්‍රී ශක්තිය එලියට අරන් මේ උලමට අමතන්න යද්දි තමා දැක්කෙ තේවි එනවා.....

හරිනේ..... දැන් නාල වරෙන්කො ඉතිං..... මෙච්චරයි අඩුවට හිටියේ.... දැන් ඉතින් දෙන්න මදි නොකියන්න දෙමාරුවට මගෙ අහිංසක චරිතෙ කෙලසන්න ගනී අප්පා..... අහෝ..... කඩවුලේ..... ඔබ කොහිද......

"උඹ පලයන් බන්. මන් මේ ගොන් ගහව බලාගන්නම්.."

දැන් ඉතින් බේරෙනවා බොරු කේම්යෝ...... මල්ලිගෙන් බේරුනත් මේ රිලා පැටිය තේවිගෙන් නම් බේරෙනව බොරු..... දැන් ඉතින් මට අබ සරණයි....... මේ වෙලාවෙ හොඳම දේ කට පියාගෙන ඉන්න එක තමයි.....

# 03 කොටස

පහුවදා උදේම මට ඕනම කරන ලට්ට ලොට්ට ටිකකුත් අරගෙන මල්ලිවයි අප්පච්චිවයි එයාර්පෝට් එකට දාලා කෙලින්ම තේව් එක්ක එයාලගේ ගෙදරට ආවා. තේව්ලගෙ ගෙදර යද්දි නිශා අම්මි කිරිබත් හදලා. දෙයියනේ කියල කිරිබත් කෑලි පහකටත් වග කියල මගෙ රූම් එකට ගියෙ උදේ පාන්දර නැගිටපු එකේ ඇරියස් කවර් වෙන්නත් එක්ක හොඳ නින්දක් දාන්න. ඒත් ඉතින් මහසෝන දෙරට ගහනව වගේ මොකෙද්ද මන්ද දොරට තඩි බාන්න ගත්තෙ මම ඇඳට වැටෙනවත් එක්කමයි....

මොකාද යකූ දොරේ හයිය බලන්න හදන එකා.... ශිට් නිදහසේ නිදාගන්නවත් නෑනෙ අප්පා..... මේ වලාවට තමා ඉතින් අර අහිංසක ටිකට ඉන්න අපේ මල්ලි කියන උලමට නිදා ගන්න දෙන්නෙ නැතුව පෙරලපු බකට් මතක් වෙන්නේ..... ඕකට තමා කියන්නෙ දිට්ඨධම්ම වේධනීය කර්මය කියලා....

ඕ ලෙවල් කාලෙ පණ දාගෙන බුද්ධ ධර්මය පාඩම් කරපු මට මතක එකම කර්මය මතක් කර කර මම දොර ඇරල බැලුවෙ මාත් එක්ක ආත්මීය බැඳීමක් තියෙන මගෙ නින්දටයි මටයි හිතක් පපුවක් නැතුව අකුල් හෙලන පරම හතර කවුද කියලා..... ආයෙ ඉතින් කියන්න දෙයක් නෑ...... ඔය ඉන්නෙ දිලිසි දිලිසි මගෙ නින්දට බකට්

පෙරලපු උගුඩුව දත් ටිකත් විරිත්තගෙන... වෙන කවුද... තේව් නොහොත් මගෙ රීලා පැටිය... අම්මේ ඉතින් දෙන්න හිතයි දත් ටික බඩට යන්න...

" මොකද රීලවො දෙරට තඩි බාන්තේ..... මේව හොඳ හයියට හදපු බඩු කියල අප්පච්චි කිව්වෙ නැද්ද..... ආහ්..... වැඩක් නැත්තන් ගිහින් නිදා ගන්නවකෝ.... මට වද නොදී....."

විරිත්තගෙන ඉන්න රීලා පැටියට මම ඇමතුවෙ මගේ හිතේ තිබුන පරම පවිත්‍ර තරහෙන්මයි.

" යකෝ.... මගෙ ගෙදර ඉදන්ම මේකි මට දුන ගෑස්.... මේ මට කියල දත් ඇන්ද බඩට යවාගන්න තමා ඉතින් ඔය"

"මොකද්ද කිව්වෙ ඇටි කුකුළෝ..... තමුසෙ හරියට කතා කරන්නෙ මන් නිකන් බලෙන් ආව වගේනේ..... "

මම එහෙම ඇහුවෙ මට රවල නාරිලතා ගමනින් මගෙ රූම් එක ඇතුලට ආපු ඒ රීලවගෙ බෙල්ලෙන්ම අල්ලගෙන.....

"යකෝ..... මගෙ බෙල්ල අතෑරපන්.... තෝ මාව මරන්නද හදන්නෙ ගෝතියේ....."

" ඒක වුණත් මගෙ අතින් වෙන්න බැරි නෑ මිස්ටර් තේව්..... මට හරියට සැලකුවෙ නැත්තන්...."

මොනව වුනත් ගැරඬි මරල පව් පුරවගන්න අකැමැති හින්ද මන් එහෙම කිව්වේ රිලා පැටියගෙ බෙල්ල අතෑරල මගෙ ඇඳෙන් මන් ඉදගන්න ගමන්.....

"යකෝ.... මන් තව කසාදයක් බැදගත්තෙත් නෑ...... එහෙම එකේ උඹ මාව මරන්න එපා බන් ඔහොම..... බලපන්.... මේ නියපොතු පාරත් තියෙනවද කොහෙද...... "

හොඳ වැඩේ.... ඔහොම වෙලා මදි..... මට නිදාගන්නත් නෑ.... මේ හෝහපුට්ට හින්ද........ ඇයි යකූ......

" මේ ඒක නෙමේ...... මන් මේ ආවෙ පොඩි ගමනක් යමුද කියල අහන්න..... "

"මට බෑ..... තමුසෙ යන ගමනක් යනවකො රිලවො මට වද නෝදී...... ඇයි අප්පා..... මට නිදාගන්න දෙනවකෝ වදේ..... "

දැන්නම් ඉතින් මට අසූහාරදහට තද වෙනව අප්පා මේකනම් පුදුම වදයක් දෙන්නේ. තවම කණ්ණාඩිය ඉස්සරහට වෙලා මගෙ ටයිගර් නේල් වලට අහුවෙච්ච බෙල්ල බල බල හිටිය රිලා පැටියට මදි නොකියන්න මන් හිතින් සිංහල භාෂාවම ඇමතුවා.

හිතින් විතරක් හිත්ද හොඳයි. මන් බැනපුව ඇත්තටම ඇහුණනම් කිව්වත් වගේ මට දත් සෙට් එකක් පංචිකාවත්තෙන් හොයන්න වෙනනේ.

" ඒ කියන්නෙ තමුසෙ බීච් යන්න කැමති නෑනේ...... ඕකේ..... මන් යනවා..... "

හෑ..... මේක මේ බීච් යන්නද කතා කරල තියෙන්නෙ එතකොට..... සැක්..... අපරාදේ මෙයාට යම ටෝක් දෙන්න ගියේ..... හොඳ වැඩේ කේම්යෝ..... ඒත් ඉතින් කලින් කිව්වනම් බීච් ටන්නෙ කියල මන් බෑ කියන්නෙ නෑනේ.... හ්ම්..... රිලවගෙ පොකට් එකට හොඳ සුද්දයක් දාන්න තිබ්බ චාන්ස් එකනේ..... කේම්යෝ..... දැන්ම බටර් ටිකක් ගෑවනම් ශේප් කරගන්න තිබ්බා......

මගෙ මස්තිෂ්ක අර්ධගෝල මහා ගෝල චූටි ගෝල එකී මෙකී නොකී ඔක්කොම ගෝල වලට ආව මැසේජ් එකට මම කෙලින්ම ගිහින් ඇල්ලුනේ රිලා පැටියගෙ කරේ....

"ඒ ගමන මගෙ කොන්ද කඩන්නද හදන්නේ...... බහිනව සුද්දී....."

මම කරේ එල්ලුන පාර රිලා පැටිය නෑ ගහන්න ගත්තෙ නිකන් එයාගෙ ඇඟට බැරල් එකක් වැටුණ වගේ..... මේ කේම් ඕවට සැලෙයිද..... නෑනෙ නෑනේ...... මේ හයේ හතරෙ ඉන්න මගෙ රිලා පැටියට මේ චූටියට ඉන්න මම

පුලුන් කොට්ටයක් වගේ කියල මම දන්න හින්දම තව ටිකක් කරේ එල්ලුනා....

" අනේ.... මගෙ සුදු බෝලෙනේ...... මාව එක්කන් යනව නේද..... ඔව් කියන්නකෝ...... ඔව් කිව්වොත් මම බහිනවා...... මගෙ සුදු බෝලෙනේ..... හා නේද..... මාව එක්කන් යනව නේද...... හා නේද....."

"අම්මෝ..... හා හා..... බැහැපන් දැන්. මම එක්කන් යන්නම්. ලැහැස්ති වෙලා එනවා ඉක්මනට. ආ..... අර ගොන් නාම්බිටත් කියන්න. හරිද....."

තේව් හා කිව්ව පාර මම කරෙන් බැස්ස ගමන් එයාගෙ ඉස්සරහට ගිහින් එයාගෙ කම්මුලට ලොකු..... කිස් එකක් දුන්නා...... අම්මේ ඉතින් ඒ වෙලාවට තමා කොල්ලගෙ මූණ බලන්න ඕනේ..... ජම්බු පරාදයි..... මේ මූණ රතු වෙන රතුවිල්ලට..... මන් දුන්නහම මෙහෙමනම් මේකගෙ කෙල්ල කිස් එකක් දුන්නොත් එහෙම කොහොම තියෙයිද......

" අම්මේ..... මගෙ සුදු මල්ලිට ඔච්චර ලැජ්ජයිද. අප්පා....... "

මන් එහෙම කියනවත් එක්කම කොහෙදෝ හිටිය යකෙක් මෙන්න මේ රිලා පැටියට ආරූඪ වුණා. ඇයි යකූ දැන් මේ හොඳට හිටිය කොල්ලනේ.....

මේක කටුසු සුප් එහෙමවත් බිව්වද මන්ද. මෙහෙම එක පාරට වෙනස් වෙන්නේ.....

" මේ සුද්දී... තමුසෙ මට මල්ලි කියන්න එපා හරිද..."

හෑ..... මේ රිලවට මහසෝනගෙ කිරි අප්පවත් වැහිලද...... ඇයි යකූ මල්ලි කියල කියන්න එපා කියන්නේ....

" තමුසෙ මට මල්ලි කියනවට මන් කැමති නෑ. ආයෙ මට මල්ලි කියන්න එපා තමුසේ."

"ඉතින් මෝඩයෝ... ඔයා මගෙ මල්ලිනේ... මගෙ මල්ලි වගේම ඔයත් මගෙ මල්ලි තමා... ඇයි මට මල්ලි කියල කියන්න බැරි..."

මන් කියවගෙන ගිය එක මට කියල ඉවර කරන්න හම්බුනේ නෑ.... තේවි මගෙ කට දෙපැත්තෙන් තද කරල අල්ලගෙන මගෙ මූණට ලන් වුනේ ඇස් දෙකත් රතු ඇපල් ගෙඩි දෙකක් වගේ රතු කරගෙන.

"තමුසෙට මන් දැන් මොකද්ද කිව්වේ..... ආහ්..... ආයෙ ඔය කටින් එක පාරක් හරි මට මල්ලි කියල කතා කරොත් මන් උඹට මොනව කරයිද දන්නෙ නෑ...."

මේ රිලවට මොනව වෙලාද මේ..... මන් ඒ ඇස් දෙක දිහා බලාගෙන හිටියෙ මට මුකුත්ම තේරෙන්න නැති

හින්ද..... මේ මෝඩය මගෙ කට දෙපැත්තෙන් අල්ලගෙන හිටිය විදිහට මට ගොඩක් රිදුණ වුණත් ඊට වඩා මට ගොඩක් දුක හිතුණා..... මොකද මේ වෙනකන් කවුරුත් මට මෙහෙම කරල නෑ..... අඩුම ගානෙ මේ තේව්වත් මේ වෙනකන් මට මෙහෙම කරල නෑ.... ඒ දුකටම මගෙ ඇස් දෙකේ කඳුලු පිරුණ.ඒ ඇස් දිහා බලාගෙන හිටිය මට ඒ ඇස් වෙනස් වුණ විදිහ තේරුම් ගන්න පුලුවන් වුණා.... මගෙ වගේම ඒ ඇස් වලත් කඳුලු පිරෙන්න වැඩි වෙලා ගියෙ නෑ....

"සොරි සුද්දී..... "

ඇස් වල කඳුලු පුරවගෙන හිටිය තේව් මගෙ මූණවත් බලන්නෙ නැතුව කාමරෙන් එලියට ගියෙ බිත්තියටත් අතින් ගහගෙන.වෙච්ච දේ හිතාගන්න බැරුව මම එහෙම්මම ඇඳේ ඉඳගත්ත.කොච්චර කල්පනා කරත් මට තේව් ඒ විදිහට එකපාරටම වෙනස් වුනේ කොහොමද කියල හිතාගන්න බැරුව ගියා..... බීච් යෑමත් පැත්තකට දල කල්පනා කර කර හිටිය මට නින්ද ගියෙ කොයි වෙලේද කියලවත් දන්නෙ නැති මම ආපහු ඇහැරුනේ තදේට දැණුන බඩගින්න හින්ද.....

මූණත් ටිකක් හෝදගෙන පහලට ගියේ නිශා අම්මිව හොයාගෙන කන්න ඉල්ලගන්න. ඒ යද්දි තමා දැක්කෙ සෙටිය ඉදගෙන ඇස් දෙකත් පියාගෙන ඉන්න අර නපුරව.

ඒ රීලා පැටියව දැක්කෙ නෑ වගේ මන් ගියෙ නිශා අම්මිව හොයාගෙන.

"නිශා අම්මී...... කොහෙද ඔයා.... මට බඩගිනී...."

මගෙ සද්දෙ ඇහිල ඒ රීලා පැටිය මන් දිහා බලාගෙන ඉන්නව මන් දැක්කා.... මට කලින් කරපු දේට ඒ වෙලේ තරහට වඩා දුක හිතුනත් දැන්නම් තියෙන්නෙ පට්ටම කේන්තියක්.මට කරපු දේට දෙන්නම්කො රීටත් එක කියල නිශා අම්මි දුන්න බත් එක කන්න ගත්තෙ මගෙ දිහා සැඩ් මූඩ් වලින් බලාගෙන හිටිය රීලවට මදි නොකියන්න රවලා....

## 04 කොටස

"නිශා අම්මී.... කෝ මිනා....."

"එයා නිදි සුදු දූ..... කම්මැලි කියලා..... ඔයත් නිදිනේ.... ඒ හින්ද එයත් නිදගත්තා...."

"හ්ම්......"

නිශා අම්මි දුන්න බත් එකත් කාල මටම ගෙනත් තිබ්බ

චොකලට් අයිසුත් කාල මත් ආපහු මගෙ රූම් එකට ගියෙ මිනත් නිදි නිසා..... අර රිලවත් එක්ක මගෙ කතාවක් නෑනේ..... මට රිද්දුව හිත්ද..... මත් රූම් එකට යද්දි මගෙ දිහා තේව් බලාගෙන ඉන්නව මගෙ සැටලයට් වලට අහුවුණත් මම දැක්කෙ නෑ වගේ ගියා....

මම රූම් එකට වෙල ඉද්දි ටික වෙලාවකින් නිශා අම්මි මාව හොයාගෙන මගෙ රූම් එකට ආව.

"සුදු දූ..... මම තේව් එක්ක ටවුන් යනවා. නංගි එක්ක ඉන්න පුලුවන්ද පුතේ."

"හරි නිශා අම්මී ගිහින් එන්න.... මම මිනා එක්ක ඉන්නම්."

"හරි පුතේ එහෙනම් පරිස්සමින් ඉන්න"

"හරි නිශා අම්මී.. ඔයත් පරිස්සමින්"

නිශා අම්මි මගෙ රූම් එකෙන් එලියට යනවත් එක්කම දොර ගාවට තේව් ආවා. ඒත් එක්කම මම දොර වැහුවෙ ආව තරහටමයි.

මට රිද්දල දැන් ඉන්නව මූකුත්ම දන්නෙ නැති තොත්ත බබා වගේ. ඇයි යකූ..... මාව බලාගන්නම් කියල එක්කන් ඇවිල්ල මට මෙහෙම රිද්දල හරියනවද.

දෙන්නම් පුතේ බොට රිටන් එක. මට එකක් කරොත් මම එකට පහක් කරනවා.

තේව්ලගෙ වාහනේ ගිය සද්දෙ ඇහුණ හින්ද මම ශේප් එකේ ගියෙ තේව්ගෙ රූම් එක ළඟට. දෙරත් ඇරගෙන ඇතුලට යන්න කලින් මම මිනාගෙ රූම් එකට ඔලුව දල බැලුවෙ මිනා එහෙම නැගිටලද කියලා. අවුලක් නෑ.... කෙල්ල ගෙම්බ පොලවෙ ගහල වගේ හතරෙ ගාතෙ දල නිදි..... දැන් ඉතින් දර්ශන පතය පැහැදිලී.....

කේම්යෝ..... දැන් ඉතින් පලිගැනීමේ මහා සංග්‍රාමය ආරම්භ කරන්න තමා තියෙන්නේ.. එහෙනම් ඉතින් මිස්ටර් තේව්.. සොරි හොදේ...

රිලා පැටියගෙ මූණ මතක් කරන ගමන් මන් දෙර අරින්න හැදුවට මේ වෙඩිම දෙර ඇරෙන්නෙ නෑ..... මේක ඌරු තඩිය දෙර ලොක් කරලද කොහෙද ගිහින් තියෙන්නේ....

ඕ..... ශිට්.... මේ ගල් ඉබ්බ දෙර ලොක් කරලම තමා අපොයි.... දැන් ඉතින් මගෙ ප්ලෑන් ඔක්කෙම චකබ්ලාස්ට් තමා..... මැදැයි මේ රිලවට රිටන් එකක් දෙන්න ආවා.....

කොච්චර ට්‍රයි කරත් රූම් එක ඇරගන්න බැරි හින්ද ආපහු මම මගෙ රූම් එකට ආවෙ මගෙ හිතේ තිබ්බ ප්ලෑන්ස් ඔක්කෝම බිමට වැටිල කුඩු පට්ටම් වෙලා යද්දි

වෙන කරන්නත් වැඩක් නැති එකේ රිටත් පස්සට කල් දල මගෙ ෆෝන් එකත් අරගෙන ඇඳට වැටුනෙ මූණු පොතේ ට්‍රිප් එකක් යන්න... ට්‍රිප් එක කොච්චර දුර ගිහින්ද කිව්වොත් මම කන්දකින් පත බැවෙන්නත් ගියා... ඔව් ඔව්.... මට නින්ද ගිහින් තමා.... කොහොමත් ඉතින් මට නින්දත් එක්ක තියෙන්නෙ ආත්මීය බැඳීමක්. ආයෙ ඉතින් ඒකෙ දෙකක් නෑ. කොහොහරි ඉතින් වැටෙන්න යද්දිම මාව ඇහැරුනා.

"සුදු අක්කී..... මන් එනෝ....... "

"එන්න මිනා....."

"මේ...... ඇත්තටම මට කියල දෙනවකෝ..... ඔහොම කරන්නෙ කොහොමද කියලා....."

මිනා ඇඳෙන් ඉදගත්තෙ හෙන සීරියස් මූඩ් එකක් අරගෙන........

"මොකද්ද මිනා....."

"ඔහොම නිදගන්නෙ කොහොමද කියලා. ඇයි යකෝ...... මෙහෙමත් නින්දක්. සිරාවටම සුදු අක්කී...... කොහොමද අනේ ඔහොම නිදා ගන්නේ...."

"මේකනෙ මිනා...... මටයි නින්දටයි තියෙන්නෙ සංසාරගත

ආත්මීය බැදීමක්. මත් නින්ද දාල යන්නෙත් නෑ. නින්ද මාව දාල යන්නෙත් නෑ."

මන් මිනාට කියල දැම්මෙ මිනාගෙ සීරියස් මූඩ් එකට නොදෙවෙනි මූඩ් එකකින්

" එතකොට අක්කී.. ඔයාට කෑමත් එක්ක තියෙන්නෙ කොයි වගේ බැඳිමක්ද කියන්නකෝ.. "

"ඒකත් ඉතින් අර වගේම තමා මෙයා ඒ තරම් ස්ට්‍රෝන්ග් බැඳිම...."

"අන්න එහෙනම් ඒක තවත් ස්ට්‍රෝන්ග් කරන්න අපේ අම්මි කතා කරා....."

"ඇයි නිශා අම්මි කෑමක්වත් ඩවුන්ලෝඩ් කරලද....."

"ඔව් ඔව්...... "

"අඩේ මරුනේ...... යමු යමු..... අහ් හිටු මූණ ටිකක් හෝදගෙන එන්නම්කො...."

මූණත් හෝදගෙන මිනා එක්ක පහලට ගියෙ නිශා අම්මිව හොයාගෙන.... හැබැයි මට කලින් මගෙ නහය නිශා අම්මිගෙ කෑම එක හොයාගෙන ගියා. අම්මේ එන සුවද.... පාන් ටෝස්ට් කරලද කොහෙද.....

ඔව් ඔව් හිතුව හරි.පාන් ටෝස්ට් කරල ඔය තියෙන්නේ දිලිසි දිලිසි....

"අම්මෝ..... නිශා අම්මී.... එන සුවද..... "

"ආහ්.... කෙල්ල නැගිට්ටද...... අනේ අනේ..... මෙහෙමත් නින්දක්...... "

"හී..... දන්නෙ නැද්ද ඉතින්..... ඔය සුට්ටක් විතර නින්ද ගියා...."

"අම්මෝ..... මෙයාගෙ සුට්ට අපි දැක්ක නේද අම්මී..... "

"හරි හරි ඉතින්..... මේ මේ.... කද්දි කතා කරන්න හොඳ නෑ මිනා...... ඒ හින්ද මගෙ සුට්ටත් බට්ටිච්චි කතා නොකර කන්න මයෙ අම්මා....."

"අනේ චූටි දූ.... අයියට එන්න කියන්න.... ගිහින්..... "

"අනේ.... මට බෑ...... උදේ ඉදන් ගිනිපුග් ගාය හැදිල ඉන්නෙ හෝතබුවට......"

"ඒ මොකද ඒ...... "

" කවුද දන්නෙ අම්මී..... මොන යකෙක් වැහිලද කියලා....."

නිශා අම්මියි මිනයි මොනව කතා කලත් මේ වෙලාවෙ මට අදාල නෑ.... මට වැඩකුත් නෑ..... කන වෙලාවට කන දේ විතරයි..... හ්ම්....

"අනේ සුදු දූ..... ගිහින් තේව්ව එක්කන් එන්න පුතේ කතා කරාට ඇහෙන එකක්යෑ.. අර බින් ගෙට රින්ග ගත්තහම"

හෑ..... නිශා අම්මිත් ඉතින් ඕනෙ නැති වෙලාවට ඕනෙ නැති වැඩ කරනවනේ..... ඕකනෙ අප්ප ඉතින් බැරී...... මටනම් බෑ..... ඒ පුස් නාම්බ ලගට යන්න.

"අනේ නිශා අම්මී.... ඒ රිලා පැටිය එන වෙලාවක එයි අනේ.... අපි මෙන්න මෙහෙම කමු අනේ...."

මම එහෙම කියල තව පාන් කෑල්ලක් කටේ දගත්තෙ නිශා අම්මිට දත් තිස් දෙකම එළියට දල හිනා වෙන ගමන්...

"ඔයාල දෙන්න කන්න ගත්තහම රොඩ්ඩක්වත් ඉතුරු වෙන්නෙ නැති හින්ද තමා කොල්ලට එන්න කියන්න කියල කිව්වේ..... අනේ.... මගෙ සුදු දූව ගිහින් එක්කන් එන්නකෝ...."

ඕකනේ අප්පා කරන්න බැරී...... මේ නිශා අම්මි අප්පච්චිට දන්න තියෙන් හැට හතර මායම් මට දනවනේ...... ඇයි කඩවුලේ මෙහෙම..... මේ සුදු මූණ බලාගෙන කොහොමැයි බෑ කියන්නේ.......

"අම්මේ නිශා අම්මී..... ඔයැයි එක්ක බෑ සුදූ..... ඉන්නකෝ..... මන් ගිහින් එක්කන් එන්නම්....."

"සුදු අක්කී..... බලාගෙන ආහ්..... මහසෝන වැහිලද කොහෙද ඉන්නේ......"

"හා හා..... මන් ඒක බලාගන්නම්නකෝ....."

මට හිනා වෙවී හිටිය මිනාටත් රවල මම ගියෙ අර තස්පුට්ට එක්කන් එන්න..... හැබැයි ඉතින් රූම් එක ලඟට ගිහින් නතර වුණේ කොල්ල මලක් කඩනව ඇහුණ හින්ද.....
හොරෙන් අහන් ඉන්න හොඳ නෑ කවුද කාටද කියනව ඇහිල තිබ්බත් මේ වෙලාවට මට ඕව වලංගු නෑනේ...... මාත් ඉතින් රබර් කන දළ දෙරට හේත්තු වනේ කොල්ලගෙ මල අහන්නම තමා.... ඇයි ඉතින් අපිට කියපු නැති කෙල්ල කවුද කියල මාත් දැනගන්න ඕනනේ.... හ්ම්......

# 05 කොටස

"ඔහොම මාත් එක්ක කතා නොකර ඉන්න එපා මැණික.. තමුසෙ ඔහොම ඉද්දි මට හෙන පාලුයි... සොරි මැණික ඉස්සෙල්ලා කරපු දේට.. මේ අවුරුදු ගානට මට ඒ නමින් උඹ කතා කරලම නෑ... මන් කොහොමත් ඒ නම උඹේ කටින් අහන්න ආසම නෑ..... එතකොට මට මාරම අවුල් මැණික..... දන්නවද..... උඹේ ඇස් වල කඳුලු දකින්න ආස නෑ..... මම කැමති නෑ තමුසෙව නැති කරගන්න. උඹේ කෝලම් මගෙ හිත හෙල්ලුව සුද්දී... "

හෑ.... මට කියන නම කොහොමද මේ රිලව ඒ කෙල්ලට කියන්නේ..... එහම වෙන්න දෙන්න බෑ...... ඒකි මොකී වුණත් මන් බලාගන්නම්කෝ..... මන් විතරයි තේවිගෙ සුද්දී..... හ්ම්... වෙන උන්ට සුද්දි කියල හරියන්නෙ නෑ..... කවුරු හරි උරවක්ක මාලයක් එල්ලගෙන ඇති කරේ..... මටවත් කිව්වෙ නෑ මේකා... අහුවෙයිනෙ මට අතටම..... තවත් හුරතල් කරනව..... ඉවර වෙයිනේ මේ වෙඩිම..... එතකන් අහගෙන ඉන්නවා.

මන් එහෙම හිතල දෙරට කන තියාගත්තෙ තවත් මොනවද කියන්නෙ බලන්න. ඒත් එක්කම මොකෙද්ද මන්ද මගෙ ඇගේ ඇතිල්ලෙන්න ගත්තා.

ර්ර්ර්..... යකූ.... ඕපයක් හොයාගන්න දෙන්නෙත් නැතේ.......

මොකාද මේ..... අපොයි මිනා..... ඒකි මෙතන බෙරිහන් දෙන්න ගත්තොත් මේ මල අහගන්න වෙන්නෙත් නෑ....

ඒ හින්ද මිනාගෙ කට මගෙ අතින් වහල එයාට රහසින් කිව්වෙ කෑගහන්න එපා කියලා....මිනත් කෑ ගහන්නෙ නැතුව දෙරට කන තියාගත්තෙ තේව් තවම මල කඩන හින්ද ඒක අහගන්න.....

" උඹ හරි ඇට්ටරයි මැණික. දන්නවද උඹ හරිම දගයි. මන් ආසම ඒකට. මට බයයි මැණික උඹට ආදරේ කරන්න ගිහින් මේ හිටිය විදිහටවත් උඹ ගාවින් ඉන්න බැරි වෙයි කියලා. මට බයයි මගෙ ආදරේ උඹ දැනගත්තොත් මාව දල යයි කියලා"

හෑ..... මොකද්ද යකූ... මේ හතරබීරි කතාව.....

මමයි මිනයි මූණට මූණ බලාගත්තෙ ඒ ඇහැණ හරුපෙ හින්දු....

මෙච්චර වෙලා මොකා එක්කද මේක කතා කරේ..... එතකොට කෝල් එකක නෙමේද හිටියේ..... ඒ ගමන දැන් සද්දයක් නෑ..... එතකොට කෙල්ල දන්නෙ නැද්ද මේ හෝහපුට්ට ඒකිට ආදරෙයි කියලා......

මන් මනෝ පාර ගහන් ඉද්දි ආපහු තේව් කතා කරනවා ඇහුණ හින්ද මම වගේම් බර කල්පනාවක හිටිය මිනත්

ආපහු දෙරට කන තිබ්බා......

"මම බයයි මැණික උඹල දෙන්න මට නැති වෙයි කියලා. අරූ මට සහෝදරයෙක් වගේ. මට බෑ ඌව නැති කරගන්න.... ඒ වගේම උඹ මගෙ පණ මැණික.... මට උඹව ඕන රත්තරන්..... උඹ නැතුව මට ජීවත් වෙන්න පුලුවන් වෙයිද කියලවත් දන්නෙ නෑ මැණික.... ඒත් මම කොහොමද මැණික කියන්නෙ උඹට මම ආදරේ කරනව කියලා. තමුසෙට මගෙ ආදරේ දැනෙන්නෙ නැද්ද..... ආහ්..... මම කොහොමද මැණික තිස්සට කියන්නෙ උගෙ අක්කට මම ආදරේ කරනව කියලා... මම කොහොමද කියන්නේ....

"මොකක්........"

තේව් කිව්ව දේට මට කෑගැහුනත් එක්කම තේව් දෙර ඇරගෙන එළියට ආවෙ මගෙ සද්දෙ ඇහිලා..... ඇස් දෙකත් ලොකු කරගෙන මම තේව් දිහා බලාගෙන හිටියත් මිනා හිනා වෙවී මගෙයි තේව්ගෙයි මූණ දිහා බලාගෙන හිටියා..... හැබැයි ඒ කිසි දෙයක් තේරුම් ගන්න බැරුව තේව් මාරුවෙන් මාරුවට මගෙයි මිනාගෙයි මූණ දිහා බැලුවා.....

එහෙම කොහොමද වෙන්නේ..... ඈ.......ඒ කියන්නේ..... මේ..... මේ........ තේව් එච්චර ආදරේ කරන කෙල්ල මමද..... ඒත්..... එහෙම කොහොමද..... දෙයියනේ..... මන් කොහොමද විශ්වාස කරන්නේ.....

ඒත් මට දැන් ඇහුන දේවල්........

තේව් මගෙ අතින් අල්ලල මොනවද මන්ද අහද්දි තමා මන්
මේ ලෝකෙට ආවේ......ඒත් ඉතින් ඒ ඇහුවෙ මොනවද
කියලවත් මගෙ කනට ගියෙ නෑ.... ඇයි දෙයියනේ මේ
ලෝකෙ සිහියක් තියෙයිද මට දැන් ඇහුණ දේට.......

"මොකද සුද්දී.... මේ බය වෙලා වගේ..... එතකොට චූටි
තමුසෙ ඇයි මේ හිනාවෙන්නේ...... ආහ්"

බය වෙන්නෙ නැතුව තියෙයිද මනුස්සයෝ..... දැන් මේ
කියපු දේට.... ඇයි ආප්පා.....

"මේකනෙ අයියා....... වුනේ....."

මම මුකුත් නොකිය තේව් දිහා බලාගෙන හිටිය හින්ද
මිනා වෙච්ච දේ කියන්න ස්ටාට් කරාට මොකද පටන්
ගත්ත තැනම ලොක් වෙලා මේකි ආපහු මන් දිහා මනමාල
බැල්මක් දැම්ම නිකන් ඒකි මගෙ කොල්ල වගේ....

හෑ යකූ.... මේකිට මොකක්හරි ලෙඩක්ද මන්ද.... මෙතන
මට මල් මල් හිනා දන්නේ......

"අනේ මේ චූටි..... මෙතන වෙච්ච දේ කියනවකෝ....
මොකද බන් මේ සුද්දි හොල්මනක් දැකල වගේ මෙතන
බය වෙලා ඉන්නේ......"

හොල්මනක් දැක්කට එහා..... යකූ මගෙ කටට වචන එන්නෙත් නෑනේ..... ඇයි දෙයියෝ ඔයා මේ මාව අසරණ කරේ.... වෙනදට ඉබ්බෙක් දැම්මත් ලොක් කරන්න බැරි මගෙ කට අද බලෙන් ඇරියත් වචනයක් කතා කරන්න බෑනේ......

"මේකනේ මා බ්‍රෝ වුණේ...... ඔයා දැන් ටිකකට කලින් පෙම් බස් තෙපලපු ඒව මගෙ නෑන පොඩ්ඩට ඇහුණා....."

"මොකක්....."

ඒ පාර තේව් කතාකරාට තේව් බය වෙලා මගෙ දිහා බැලුවා..... ඈ..... එතකොට මන් කොහොමද නෑන පොඩ්ඩ වුණේ.... යකෝ මේකි කියන දේවල්.....

"ඔව්නෙ මගෙ අයියේ......... ඔයාගෙ කෙල්ල කවුද කියල අද මගෙ නෑන පොඩ්ඩ දැනගත්තා.... දැන් ඉතින් ඉතුරු ටික ඔයා මෙයැයි එක්ක විසඳගන්න..... මම අපේ මච්තුමියට ශේප් එකක් දන්නම්.... එහෙනම් කොල්ලො අපි ගියා..... ගුඩ් ලක් අයියණ්ඩී.... මේ චුට්ටක් පරිස්සමින්.... මගෙ නෑනගෙ හැටි දන්නවනේ..... "

තේව් ඔලුව කස කසා මන් දිහා බලද්දි මිනා මගෙ කම්මුලට කිස් එකක් දීල පහලට දිව්වා.

ඒත් එක්කම තේව් මාව එයාගෙ රූම් එකට ඇදල අරගෙන දෙර ලොක් කරා.

"සුද්දී....."

"මොකද......"

"ඇත්තටම මම කියපු ඒවා ඔයාට ඇහුනද......."

ඇහුනද කියල මගෙන් අහන හැටි විතරක්.... යකූ.... මේකට දෙකක් දෙන්න හිතෙන්නෙ මේ වෙලාවට තමා අම්මපා.... ඈ යකූ..... අක්කට ආදරේ කරල තව ඇහුනද කියලත් අහන්න එනවනේ..... අම්මපා ළඟ පාතකවත් මේකට හොඳවයින් දෙකක් දෙන්න එකක් නැති හැටි.....

හොද පාරක් දෙන්න හිතාගෙන රූම් එක වටේට ඇස් අරන් ගියෙ මොකක් හරි එකක් හොයාගන්න.... ඒත් එක්කම ළඟ තිබ්බ මමම තේව්ගෙ කලින් බර්ත්ඩේ එකට අරන් දුන්න ගිටාර එක දැකල ඒක අරගෙන ඒ රිලා පැටියට ගහන්න ළඟට පැන්නත් මගෙ ඉස්සරහින් ඇදල තිබ්බ ෆෑන් එකේ වයර් එකේ පැටලිලා තේව්වත් පෙරලගෙන අපි දෙන්නවම ඇඳේ පතබෑවුණා.... ඒත් එක්කම මගෙ අත් දෙකෙන් තේව් අල්ලගත්තෙ මට නැගිට්ටින්න බැරි වෙන්න..... මටත් කලින් මගෙ අතේ තිබ්බ ගිටාර් එක ඇඳට වැටුනෙ මගෙන් බිරුණ සතුටටද කොහෙද....

නැත්තන් ඉතින් තේව් වගේම ගිටාර් එකත් අද ඉතුරු වෙන්නෙ නෑ......

"සුද්දී .... මාත් එක්ක තරහද මැණික.....ම්ම්ම්....."

ඒ රිලා පැටියෙගෙ ඇඟ උඩ පත බැව්ලා හිටිය මගෙන් එහෙම ඇහුවෙ මගෙ මූණට ළන් වෙලා........ තරහ නෙමේ ඉතින්.... මේ වෙලාවට තමා ගඟේ මාළුයි මුහුදෙ මාළුයි.... වෙලේ මාළුයි ඔක්කොම එකට මගේ ඇඟේ ඩාන්ස් කරන්නේ.......

"මේ..... මී හරකෝ.... අතාරිනව මාව"

"නෑ..... අතාරින්නෙ නෑ...... මාත් එක්ක තරහ නෑ නේද කියන්නකො සුද්දී......."

"තරහ නෙමේ.... තමුසෙ දැන් මාව අතෑරියෙ නැත්තන් මන් මරණවා....."

"මරපන් සුද්දී..... උඹ නැතුව ජීවත් වෙනවට වඩා මැරෙන එක සැනසීමක් මගෙ මැණික"

මම කොච්චර තරහෙන් හිටියත් ඇස් වල කඳුලු පුරවගෙනෙ තේව් ඒ කිව්ව දේට මගෙ හිත ගැස්සුනෙ නෑ කිව්වොත් ඒක බොරුවක්...... පොඩ්ඩක් නෙමේ..... හොඳටම හිත ගැස්සුනා.....

මොකද මෙච්චර වෙලා තනියම තේවි කියපු දේවල් වලින් මම තේරුම් ගත්ත තේවිගෙ ආදරේ කොච්චරද කියලා......

"ඇතැරිය සුද්දි උඹව..... පලයන්.... හැබැයි..... මාව මරලම......"

තේවිගෙ ඇස් දෙක දිහා බලාගෙන හිටිය මිසක් තේවි මගෙ අත අතෑරල තියෙන්නෙ කියලවත් මට තේරුණේ නෑ...... තේවි කිව්වට පස්සෙ තමා මාව අතෑරල කියල මට තේරුණේ.....ඒත් එක්කම මම තේවිගෙ ඇඟෙන් ඈත් වෙලා හිටගත්තෙ නිකන් කරන්ට් එක වැදිල වගේ..... ඒත් එක්කම තේවි ඇඳෙන් ඉදගත්තා..... මන් එතනින් එන්න හැදුවත් මට එන්න බැරිවුණේ තේවි ආපහු මාව අල්ලගත්ත නිසා.....

"අතාරින්න තේවි..... මට යන්න දෙන්න...."

මම එතනින් ඉක්මනට යන්න ට්‍රයි කරේ මගෙ හිත ගැහෙන්න ගත්ත නිසා..... තේවි නැඟිටල ළඟට ආවොත්නම් සත්තයි මගෙ පපුව ගැහෙන ලබ් ඩබ් සද්දෙ හොඳටම ඇහෙයි.... ඒ තරම්ම මාව ගැහෙන්න ගත්තා.....

මම මගෙ අත ගන්න කොච්චර ට්‍රයි කරත් මගෙ අත තේවිගෙන් ගලවගන්න පුලුවන් වුනේ නෑ...... මගෙ අත අතාරිනව වෙනුවට තේවි කරේ මගෙ ළඟට ආව එක.... ඒ ඇවිත් එයාගෙ එක අතක් මගෙ ඉන වටේ දගෙව මාව

එයාගෙ ඇඟටම හේත්තු කරගත්තා. සත්තයි ඒ වෙලාවෙ මට හිටගෙන ඉන්නවත් පණ තිබ්බෙ නෑ. තේව් මට හිතන්නවත් කාලයක් දෙන්නෙ නැතුව මගෙ තොල් එයාගෙ තොල් වලින් අල්ලගත්තෙ මාව තවත් සීතල වෙලා යද්දි....... තේව්ව මම නවත්තන්න එයාව තල්ලු කරත් ඒකෙන් වුණේ මට දගලන්න බැරි වෙන්නම මාව තවත් තේව්ගෙ ඇඟට තද කරගත්ත එක. මට හෙල්ලෙන්නවත් බැරුව ඉද්දි තේව් මගෙ තොල් වලට තවත් බර වුනේ මගෙ ඇස් දෙකත් පියවෙද්දී......

## 06 කොටස

මගෙ තොල් වලින් තේව් ඈත් වුණ ගමන් මන් දුවගෙන ආවෙ මගෙ රූම් එකට.

"මැණික..... නවතින්නකෝ..... "

තේව් මට කතා කරනව ඇහුණත් මම ඇහුණෙ නෑ වගේ දුවගෙන ආවෙ මට තවත් එතන ඉන්න තරම් සිහියක් තිබුණෙ නැති නිසා. මගෙ රූම් එකට ආව ගමන් මම රූම් එකේ දොර ලොක් කරගත්තෙ තේව් මගෙ පස්සෙන් ඇවිත් මගෙ රූම් එකට එයි කියල බය හිතුන නිසා.

දෙයියනේ..... මොනවද මේ වෙන්නේ.... ඒ මෝඩය කොහොමද මට ආදරේ කරන්නෙ.... එහෙම වෙන්න දෙන්න බෑ කොහොමත්..... මම ඒ මෝඩයගෙන් ඈත් වෙලා ඉන්න ඕනා.... කොහොමටත් තේව්ටනම් ළන් වෙන්න දෙන්න බෑ...... කොහොමටත් බෑ....... ඒත්.... ඒත් මම කොහොමද තේව් මාව කිස් කරනකන් එහෙම හිටියේ..... දෙයියනේ.... මට ඒ මෝඩයව නවත්තන්න තිබ්බා..... ශිට්..... ඇයි මම ඒ මෝඩ වැඩේ කරේ.....ආයෙනම් ඒ වැරැද්ද මගෙ අතින් වෙන්න දෙන්න බෑ..... කොහොමහරි තේව්ගෙ හිතින් මාව අයින් කරන්න වෙනවා..... කොහොමහරි ඒක කරන්නම වෙනවා.......

"සුදු අක්කී......."

මම වෙච්ච දේවල් කල්පනා කර කර ඉද්දි මිනා ඇවිත් කතා කරා. මම ගහින් දෙර ඇරියෙ මිනාට රූම් එක ඇතුලට එන්න කියන ගමන්.

"එන්න මිනා....."

"මොකෝ අනේ මේ බය වෙලා සුදු අක්කී..... තිකන් හොල්මනක් දැකල වගේ"

"බය වෙන්නෙ නැද්ද මිනා... තේව් අර කිව්ව දේවල් වලට"

ඇත්තටම මම තවමත් ඉන්නෙ බය වෙලා. ඒත් මිනාටනම් ඒකෙන් ගානක්වත් නෑ..... එයාට ඒ වෙච්ච දේ පුදුමෙකුත් නෑ..... මිනා හිටියෙ මගෙ මූණ දිහා බලාගෙන හිනා වෙවී......

"ඔයාට හිනා..... මම මේ බය වෙලා ඉන්න තරම මම විතරයි මිනා දන්නේ.. අනේ..... කොහොමද මිනා තේව් එහෙම කරන්නේ.. මට තේරෙන්නෙ නෑ මිනා..."

මම දන්නෙ නැතුවම මගෙ ඇස් වලින් කඳුලු ආවා. මට කිසිම දෙයක් හිතාගන්න බැරුව හිටියේ.... මගේම මල්ලි වගේ හිටිය තේවේගෙ හිතේ මත් ගැන තියෙන්නෙ අක්කෙක්ට තියෙන ආදරයක් නෙමේ කියල දැනගද්දි මට හිතාගන්න බැරි වුණා..... කිසිම දෙයක් කියාගන්න කෙනෙක් නැතුව ඉද්දි මිනා එක්ක ඒ දේවල් කතා කරද්දි මගෙ ඇස් වලින් කඳුලු ආවෙ මටත් හොරෙන්මයි.

"අනේ.... මගෙ සුදු අක්කී...... අඬන්න එපා.... මේ බලන්න..... දන්නවද.... ඔයා අඬනවට අපි කවුරුත් කැමති නෑ...... ඇයි මේ අඬන්නේ..... ඇයි සුදු අක්කි..... ඔයා අපේ අයියට කැමති නැද්ද අක්කී...... ඔයා එයාට ආදරේ නැද්ද අක්කී....."

"දෙයියනේ මිනා..... මොනවද මේ අහන්නේ..... මම ආදරෙයි දෙයියනේ ආදරෙයි...... මම මගෙ ජීවිතේටත් වඩා

මගෙ මල්ලිල දෙන්නට ආදරෙයි...... තේව් කියන්නෙත් මගෙ මල්ලි..... මගෙ හිතේ තේව්ට තියෙන්නෙ මගෙ මල්ලිට තියෙන ආදරයක්..... නැතුව එයා මගෙන් බලාපොරොත්තු වෙනව වගේ ආදරයක් නෙමේ මිනා..... එහෙම දෙයක් නෙමේ..... "

"ඒත් සුදු අක්කී.... අපේ අයිය ඇත්තටම ඔයාගෙ මල්ලි නෙමේනෙ අක්කි..... ඔයාගෙ මල්ලි සුදු අයියනේ....."

"නෑ.... නෑ...... මිනා..... තේව් කියන්නෙත් මගෙ මල්ලි වගේ තමා....."

"නෑ.... වගේ වුණාට ඔයාගෙම මල්ලි නෙමේනෙ සුදු අක්කී..... අක්කිට අපේ අයියගේ ආදරේ තේරුණේම නැද්ද සුදු අක්කී.... ආහ්.... එයා ඔයාට කොච්චර ආදරේ කරනවද කියල මන් තරම් වෙන කවුරුත් දන්නෙ නෑ...... දැන් ටිකකට කලින් අයිය එයාගෙ රූම් එකට වෙලා කියවපුව මාත් අහගෙන හිටියෙ බය වෙලා... මොකද මන් දන්නවනෙ එයා ඔයාට කොච්චර ආදරේ කරනවද කියලා.... ඒත් මට හිතා ගන්න බැරිවුනා එයා කාත් එක්කද ඒ කතා කර කර හිටියෙ කියලා..... පස්සෙ තේරුණා එය තනියම ඒ කතා කරන්නෙ කියලා..... ඒකත් ඔයා ගැනම කියලා..... දන්නවද එයා පුදුම විදිහට විදෙව්ව ඔයාට ආදරේ කරනව කියල කියාගන්න බැරුව..... හැමදම අඬනව මාත් එක්ක ඔයාව එයාට නැති වෙයි කියල බයයිලු..... මගෙ අයිය පිස්සෙක් වගේ අක්කි ඔයාට

ආදරේ කරන්නේ...... ඒ හින්ද ටිකක් ඒ ගැන හිතන්න සුදු අක්කි....... එයා පවු සුදු අක්කී..... ඒ ආදරේ පුදුමයි සුදු අක්කි..... ඔයාට එයාගෙ ආදරේ නොතේරුනාට එයා ඔයාට කොච්චර ආදරේ කරනවද කියලා මම දන්නවා..... අනේ.... අයිය ගැන හිතන්න මගෙ අක්කියෝ....."

මිනා එහෙම කියල මගෙ රූම් එකෙන් එලියට ගියෙ මාව තවත් අසරණ කරල. මගෙ ඇස් දෙකෙන් කඳුලු වැටුනෙ මිනා කිව්ව ඒව තව තවත් මතක් වෙලා.....

දෙයියනේ..... තේව්..... ඇයි මාව ඔහොම අසරණ කරන්නෙ පැටියෝ..... ඇයි ඔහොම කරන්නෙ.ඔයා කොහොමද මට එහෙම ආදරේ කරනනේ..... ඔයා ආදරේ කරත් මම කොහොමද ඔයාට ආදරේ කරන්නේ..... ඒක කොහොමත් වෙන්නෙ නෑ.......... මම ඔයාගෙ අක්කා..... කීයටවත් ඒක වෙන්න දෙන්නෙ නෑ.... ඔයාගෙන් මම පුලුවන් තරම් ඈත් වෙන්න ට්‍රයි කරනවා.....

මගෙ හිතටම මම එහෙම පොරොන්දු වෙලා වොශ් රූම් එකට ගියෙ මගෙ මූණ හෝදගන්න.
කණ්ණාඩිය ඉස්සරහට ගිය මගෙ අත මටත් හොරෙන්ම ගියෙ තේව් කිස් කරපු මගෙ තොල් ගාවට.

ආයෙ ඒ වැරැද්ද වෙන්න දෙන්නෙ නෑ තේව්. ඔයාගෙ හිතේ මම ගැන ආදරේ වැඩි වෙන පොඩිම දෙයක්වත් මගෙ අතින් ආයෙ වෙන්නෙ නෑ....

මම එහෙම කල්පනා කරේ තේව් කිස් කරපු මගෙ තොල් මගෙ ඇඟිලි වලින් අතගාන ගමන්.මූණත් හෝදගෙන මම පහළට ගියෙ නිශා අම්මි දැන් රෑට කෑම හදන්න පටන් ගන්න වෙලාව නිසා.

"නිශා අම්මී....."

"සුදු දූ..... මොකෝ මේ මූණෙ හැටි..... මූණ තඩිස්සි වෙලානෙ මැණික"

"අහ්.... මගෙ ඔලුව ටිකක් කැක්කුම ඇල්ලුව නිශා අම්මි"

"අනේ.... ඒ මොකද මැණික.... කෝ බලන්න..... ඇඟනම් රස්නෙ නෑ..... "

මගෙ පොඩි වෙනසක් වුණත් නිශා අම්මිට ඇඳුරගන්න පුලුවන්.... කොච්චර මූණ හෝදගෙන ආවත් එයා මගෙ මූණෙ වෙනස අඳුනගත්ත.ඒ වගේම මට පොඩි හරි අසනීපයක් වුනොත් මගෙ අම්මි වගේ මාව පරිස්සමට බලා ගන්නව.

"දැන් අඩුයි නිශා අම්මී..... කෝ කියන්නකෝ.... ඔයා මොනවද රෑට කන්න හදන්නේ.... මමත් උදව් කරන්නම්"

"මේ.... මගෙන් ගුටි නොකා ඉන්න සුදු දූ..... කෝ මෙතනින් ඉදගන්න. ඔයා පෙනඩෝල්වත් බිව්වෙ නැද්ද මැණික..... ආහ්.... ගොඩක් රිදෙනවද පුතේ..... "

"පෙනඩෝල් ඕනෙ නෑ..... අනේ දැන් අඩුයි නිශා අම්මී...... "

"ඇයි පුතේ මට කිව්වෙ නැත්තේ....."

නිශා අම්මි මාව පුටුවෙන් ඉන්දවල මගෙ ඔලුව අතගාන්න ගත්තෙ මම එයාගෙ ඉන වටේ අත දාල එයාගෙ ඇගට ඔලුව තියාගද්දි.ඒත් එක්කම මිනා එක්ක තේව් කුස්සියට ආවා.

"බලන්නකො අයියා.... අපේ අම්මිටත් අපි දෙන්නව අමතකයි සුදු අක්කි ඉන්නවනම්..... "

"අනේ දේණි.... විකාර කියවන්නෙ නැතුව ගිහින් පෙනඩෝල් දෙක්ක අරන් එන්න. මේ කෙල්ලගෙ ඔලුව රිදෙනවලු."

"සුද්දී...... ගොඩක් රිදෙනවද..... අම්මී..... අපි බෙහෙත් ටිකක් ගේන්න යමුද..... "

නිශා අම්මි මගෙ ඔලුව රිදෙනව කිව්ව පාර තේව් මගෙ ළඟට ඇවිත් මගෙ නලළට අත තියල බලද්දි මට එයාගෙ

ඇස් දිහා බැලුනා..... ඒ ඇස් වල තියෙන්නෙ මොනවද කියල මට තේරුම් ගන්න බැරි වුනේ නෑ..... ඒ ඇස් වල තියෙන්නෙ ආදරේ විතරමයි..... එදත් තිබ්බෙ මේ ඇස් වල මේ ආදරේම තමයි. ඒත් ඒ ආදරේ මන් හැමදාම තේරුම් ගත්තෙ මල්ලි කෙනෙක්ගෙ ආදරේ විදිහට. ..... ඇත්ත මගෙ මල්ලිගෙ තියෙන ආදරේ නෙමේ තේවිගෙ ඇස් වල තියෙන්නේ..... අනේ.... මන් මේ දේ කලින් තේරුම් ගත්තනම් ඒ ආදරේ මෙච්චර දුර අරන් එන්නෙ නැති වෙන්න මට තේවිගෙන් ඈත් වෙන්න තිබ්බා.....

"සුද්දී..... ඇයි මේ..... අඬන්නේ..... ගොඩක් අමාරුද මැණික....."

මාව ගැස්සුනේ තේවිගෙ කටහඬින්...... මම මෙච්චර වෙලා තේවිගෙ ඇස් දිහා බලාගෙන ඉදල තියෙන්නෙ.ඒත් ඇයි මේ මගෙ ඇස් වලින් කදුලු එන්නේ......

"ඒකනේ සුදු දූ..... අමාරුද පුතේ..... අපි යමුද බෙහෙත් ගේන්න.... "

"අනේ..... ඕනෙ නෑ..... පෙනඩෝල් දෙකක් බිව්වහම අඩු වෙයි නිශා අම්මී..... "

"ඒත් පුතේ......"

"නෑ නිශා අම්මී...... අද පාන්දර ඇහැරුනානේ..... ඒ හින්ද වෙන්න ඇති....."

"හ්ම්.... එහෙනම් පෙනඩෝල් බීල මගෙ මැණික ටිකක් ඇල වෙලා ඉන්නකො ඇඳට ගිහින්....... චූටි දූ..... අක්කිව රූම් එකට එක්කන් ගිහින් පෙනඩෝල් පෙති දෙකක් දෙන්නකෝ..... "

"හා අම්මී......"

"නංගී.... තමුසෙ ඉන්නවා.... මම දෙන්නම්..... අම්මට උයන්න උදව් වෙනවකෝ.... මම සුද්දිව එක්කන් යන්නම්....."

"ඔව් පුතේ.... ඒකත් ඇත්ත.... චූටි දූ ඔයා එන්නකො මට උදව් වෙන්න.... ඉක්මනට උයල එනකොට මගෙ කෙල්ලට කන්න දෙන්න පුලුවන්.... යන්න පුතේ..... මම ඉක්මනට උයල එන්නම්....."

"කෝ එන්න සුද්දී......."

"ඕනෙ නෑ තේව්...... මට යන්න පුළුවන්.... රූම් එකේ පෙනඩෝලුත් තිබ්බා....."

"අනේ මේ.... මෙන්න මෙහෙ එනව පණ්ඩිතය නොවී....

"අනේ..... පුතත් එක්ක යන්නකෝ සුදු දූ......"

මට ඕන වුණේ තේව්ව මගාරින්න. ඒත් ඒක කරන්න බැරි වුණා... මොකද මම තනියම යන්නම් කියල ගියත් තේව් මගෙ පස්සෙන්ම ආව නිසා..... මම රූම් එකට ගිහින් තේව් රූම් එකට එන්න කලින් දොර වහන්න හැදුවත් එයා මම දොර වහන්න කලින් මගෙ රූම් එක ඇතුලට ආව.

"දැන් මම රූම් එකට ආවනේ තේව්.... ඔයා යන්න..... "

"සුද්දී....."

තේව් මගෙ උරහිස් වලින් ඇල්ලුවත් මම තේව්ව තල්ලු කරේ මගෙන් ඈතට යන්න.

"එපා ළඟට එන්න...... මට තනියම ඉන්න ඕන.... ඔයා දැන්ම මගෙ රූම් එකෙන් එලියට යන්න..... ප්ලීස්...... "

"සුද්දී...... "

මම තේව්ව තල්ලු කරත් ආපහු තේව් මගෙ උරහිස් වලින් ඇල්លුව.ඒත් එක්කම කේන්තියෙන් තේව්ගෙ මූණ දිහා බලපු මගෙ ඇස් නැවතුනේ කඳුලු පුරවන් රතු වෙලා තියෙන තේව්ගෙ ඇස් ළඟ.

ඔහොම බලන්න එපා දෙයියනේ..... ඔහොම බලන්න

එපා...... මාව ගොඩක් අසරණ කරනව තේව් ඔයාගෙ ඔය ඇස්......

මම මගෙ හිතත් එක්කම කියවගත්තෙ ඒව වචන වලින් තේව්ට කියන්න තරම් හයියක් මට නැති හින්දා.....

"අනේ.... ඔහොම කරන්න එපා මගෙ මැණික.... ඉස්සර වගේ හිටපන් දෙයියනේ..... උඹ ඔහොම ඉද්දි මගෙ පපුව හිරවෙනව සුද්දී..... තමුසෙ ඔහොම මාව මගෑරියොත් මම පිස්සෙක් වෙයි සුද්දී..... පිස්සෙක් වෙයි..... උඹට ඕනෙ මම පිස්සෙක් වෙනව දකින්නද සුද්දී..... ඇයි මගෙන් ඈත් වෙන්න හදන්නෙ මගෙ මැණික..... උඹට මගෙ ආදරේ පොඩ්ඩක්වත් තේරුණේ නැද්ද මගෙ මැණික..... ආහ්..... තේරුණේ නැද්ද...... උඹට ඕනෙ මගෙන් ඈත් වෙන්නද සුද්දී..... කියනවා.... මගෙන් ඈත් වෙන්නද ඕනා..... පලයන්.... හැබැයි මාව මරලම පලයන්...... මාත් එක්ක උඹට තියෙන මගෙ ආදරෙත් මරලම පලයන්..... මාව මැරුවත් උඹට තියෙන මගෙ ආදරේ මරන්න උඹට බැරි වෙයි සුද්දී..... බැරි වෙයි.....

මගෙ උරහිස් වලින් අල්ලන් මාව හොලව හොලව අඬ අඬා කියවන තේව් දිහා බලන් ඉන්න මගෙ ඇස් වලිනුත් කඳුලු වැටුනා.... මමත් අඬ අඬම තේව්ගෙ කඳුලු පිහදැම්මෙ තවත් තේව් අඬනව මට බලන් ඉන්න බැරි නිසා....

"උඹ මගෙ පණ මැණික..... මාව උඹෙන් ඈත් කරන්න එපා සුද්දී...... ඈත් කරන් එපා....."

තේව් මාව එයාගෙ පපුවට තුරුළු කරගත්තෙ අඬ අඬාමයි.මමත් එයාට තුරුල් වෙලා ඇඬුවෙ එයාගෙන් ඈත් වෙන්න මගෙ හිත හදාගන්න බැරි නිසා......ඒත් මම මේ කරන දේ වැරදි කියල මට තේරුණ නිසා මම ඉක්මනින් තේව්ගෙන් ඈත් වෙලා වොශ් රූම් එකට දිව්වා.... ඒක ඇතුලට වෙලා ශවර් එකත් ඇරල මම ඇතිවෙනකව් ඇඬුවෙ මගෙ හිත හදාගන්න හින්දා.... ඒත් මම අඬන හේතුව මටවත් හිතාගන්න බැරි වුණා........ මට තේරුණ එකම දේ තේව්ගෙන් ඈත් වෙන එක තමා මේ වෙලාවෙ හොඳම කියලා......

මම ඇතිවෙන්න අඬලා වොශ් රූම් එකෙන් එලියට එද්දි තේව් හිටියෙ නෑ..... මාත් ගිහින් ඇඳෙන් ඇල වුණේ ඇත්තට මගෙ ඔලුව රිදෙන්න ගත්ත නිසා......මගෙ කම්මුලට දැණුන සීතලත් එක්ක ඔලුව අමාරුව නිසා නිදාගෙන හිටිය මාව ඇහැරුණා. එත් එක්කම මම දැක්කෙ මගෙ ඔලුව අත ගාන නිශා අම්මිව.

"දැන් අඩුයිද පුතේ....."

"හ්ම්..... ඔව් නිශා අම්මී..... "

"ඉන්නකෝ..... මන් බත් බෙදාගෙන එන්නම් කවන්න....."

"ශෝක්නේ....... ඔයාල කාලද නිශා අම්මී...... "

"නංගි කාල නිදි.මමත් කෑවා.... බෙහෙත් බොන්න තිබ්බ මැණක.තේව්නම් තවම කෑවෙ නෑ..... ඉන්නකෝ.... එයාටත් බෙදල දීල ඔයාට බත් එක අරන් එන්නම්...."

"මම පහලට එන්නම් අනේ....."

"ගුටිනොකා ඉන්න කිව්වෙ ඔහොම.... මන් එනකන්"

"හරි හරි මන් ඉන්නම්"

නිශා අම්මි බත් එක ගේනකන් මම ඇඳට වෙලා කල්පනා කර කර හිටියෙ අද වුණ දේවල් ගැන.ඒත් එක්කම බත් එකත් අරගෙන මගෙ රූම් එකට ආවෙ නිශා අම්මි වෙනුවට තේව්.

# 0 7 කොටස

"කෝ නිශා අම්මි... ඇයි ඔයා ආවේ....."

"ඇයි මන් එනවට කැමති නැද්ද සුද්දී......"

තේව් එහෙම ඇහුවෙ ඇදෙන් ඉදගන්න ගමන්

"කෝ දෙන්න බත් එක..... ඔයත් ගිහින් කන්න.... මට කන්න පුළුවන්....."

තේව් අහපු දේ මම ගනන් නොගෙන එයාගෙ අතේ තිබ්බ බත් එක මගෙ අතට ගත්තෙ එයාට හිතන්නවත් කාලයක් නොතියා......

"සුද්දී........ මන් ඔයා ළඟට එනවට කැමති නැද්ද....."

මම තේව් අහන ඒව ගනන් නොගෙන කන්න ගත්ත.මගෙන් උත්තරයක් නැති තැන තේව් නැඟිටල යන්න ගියෙ කේන්තියෙන් කියලනම් මට හොඳටම තේරුණා....

ඔයාගෙන් ඈත් වෙන්න මම ඔයාට මීට වඩා නපුරු වෙයි තේව්..... සොරි තේව්.......

කේන්තියෙන් යන තේව් දිහා බලාගෙන මගෙ හිතටම කියාගත්තෙ මටම තේරුම් ගන්න බැරි මොකද්දෝ ලොකු දුකක් මගෙ පපුවට දැනෙද්දි. මම කාල ඉවර වෙලා පහලට යද්දි පහළ හිටියෙ නිශා අම්මි විතරයි.

"කෝ මැණික තේව්..... එයා ඔයාට කවන්නම් කියලනෙ ආවේ...... "

"ආහ්.... මන් එයාට කන්න කියල පහලට එව්වනෙ නිශා අම්මී.... ආවෙ නැද්ද...."

"නෑ පුතේ..... මන් හිතුවෙ තවම ඔයාට කවනව කියලා....."

නිශා අම්මි එහෙම කිව්වහම මගෙ හිතට ලොකු දුකක් දැනුනා...... කොච්චර ඇත් වෙන්න හැදුවත් මගෙ යටි හිත කිව්වෙම තේව්ව ගිහින් බලන්න කියලා..... ඒ හින්දම අතත් හෝදල මම යන්න හැදුවෙ තේව්ව එක්කන් එන්න.... ඒත් යන්න හදපු මම එතනම නැවතුනේ නිශා අම්මි මට කතා කරපු නිසා....

"සුදු දූ....... පොඩ්ඩක් ඉන්න මැණික"

"ඕ...... කියන්න නිශා අම්මී"

නිශා අම්මි මගෙ ළඟට ඇවිත් මගෙ අතකින් අල්ලගෙන මගෙ ඇස් දිහාම බැලුව.

"සුදු දූ........ මට ඇත්ත කියන්න පුතේ....ඔයයි අපේ ලොකුයි අතර මොකක් හරි වුණාද"

නිශා අම්මි ඒ අහපු දේට මගෙ ඇස් ගැස්සුණා. මගෙ ඇස් දිහාම බලාගෙන හිටපු නිශා අම්මි මගෙ ඇස් ගැස්සෙනව හොඳටම දැක්කා. ඒත් මම එයා දිහා හිනා වෙලා බැලුවෙ මගෙ ඇස් වල වෙනස එයාගෙන් හන්ගන්න ඕන නිසා.

" අයියෝ නිශා අම්මි එහෙම අහන්නේ.... මට තේරුණේ නෑ..."

මම නිශා අම්මිගෙන් එහෙම ඇහුවත් මම හොඳටම දන්නවා අපිව උපන් ද ඉඳල දන්න නිශා අම්මිට අපේ පොඩි වෙනසක් වුනත් ඇඳුරගන්න පුලුවන් කියලා.

"නෑ.... පුතේ.... ඔයාල දෙන්න අද හරි වෙනස්. දෙන්න රණ්ඩුවක් වුණාද.. ඒත් වෙනද රණ්ඩු වුණහම ඉන්නව වගේ නෙමේ. ඒකයි ඇහුවෙ පුතේ...."

"එහෙම මුකුත් නෑ නිශා අම්මී.. ඉන්නකෝ.... ඒ රිලා පැටියව මම එක්කන් එන්නම්කෝ......"

නිශා අම්මි මුකුත්ම කියන්න කලින් මම උඩට ගියෙ තේව්ව හොයාගෙන. තේව් ළඟට යන්න හිතට මහ බරක් වගේ දැනුනත් මම තේව්ව හොයාගෙන ගියෙ එයා බඩගින්නෙ නිසා.

වැඩ්ඩ වගේ ආවට මොකද අප්පා.. මේ රිලා පැටියත් එක්ක කතා කරන්න මහ මොකද්ද වගේ.... ඇයි මෝඩයො මාව මෙහෙම අමාරුවක දැම්මේ......

මම තේව්ට කතා කරන්නෙ නැතුව රූම් එක ඉස්සරහ එහා මෙහා ඇවිද්දෙ එයාට කතා කරන්න තරම් මගෙ හිත හදාගන්න බැරි නිසා. මොකද්දෝ අමුත්තක් හිතට දැනෙන නිසා. ඉස්සර කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව මේ රූම් එකට කොච්චර ගිහින් තිබ්බත් මට දැන් එහෙම යන්න හිත හදාගන්නම බෑ. ඒකට හේතුව තේව් මට ආදරේ කරනව කියල මම දැනගත්ත නිසාම තමා. ඉස්සර වගේ මට දැන් එයාට ළං වෙන්න හිත දෙන්නෙ නෑ. තේව් දැන් මට ගොඩක් නුහුරු කෙනෙක් වෙලා. එයා බඩගින්නෙ කියල දන්න නිසා හිත හදාගෙන දොරට තට්ටු කරන්න හදද්දිම වගේ තේව් දොර ඇරගෙන රූම් එකෙන් එලියට ආව.

පෙනුමෙන්නම් කොහෙහරි යන්න වගේ.... ඒත් මේ රෑ කොහෙ යන්නද.....

නිල් ඩෙනිමට කලු අත් දිග ශර්ට් එක ඇඳලා.... අත් දෙක වැලමිට ළඟටම නවලා..... මොනව නැතත් මාරම ලස්සනයි.

අනේ කාර් එකේ යතුරත් තියනවා..... ඒ කියන්නේ කොහෙහරි යන්නම තමා.....

තේව් මගෙ දිහා බලාගෙන ඉදල අනිත් පැත්ත හැරනෙ යන්න. ඒත් එක්කම මම තේව්ගෙ අතක් අල්ලගත්ත. තේව් මගෙ දිහා බලල ආපහු අත දිහා බැලුවෙ ඇයි කියල ඇස් වලින් අහල....

" කොහෙද රිලවො යන්නෙ මේ මහ රෑ....."

ඉස්සර විදිහටම මම කතා කරේ මගෙ වෙනසක් පේන්නෙ නැති වෙන්න. තේව් මට ආදරේ කරනව කියල බලෙන්ම අමතක කරන ගමන්.

"ඇයි අහන්නේ.... තමුසෙට වැඩක් නෑ මම කොහෙ ගියත්... මම තමුසෙගෙ කවුරුත් නෙමේනෙ..."

ඇත්තටම තේව් ඒ කියපු දේට මට කේන්ති ගියා. ඒ නිසාම තේව් මගෙ පැත්තට හරවගෙන මම ඒ මූණ දිහා බැලුවෙ කේන්තියෙන්. ඒත් තේව් මගෙ බැල්ම ගනන් නොගෙනම අහක බලාගත්තා. ඒ නිසා මගෙ කේන්තිය තවත් වැඩි වුනා.

"මේ තේව්.... මම අහන දේට උත්තර දෙනවා..... තමුසෙ කොහෙද මේ රෑ යන්න හදන්නේ...... ආහ්."

"මන් දැන් කිව්වා කේම්..... මන් කොහෙ ගියත් තමුසෙට වැඩක් නෑ....."

මෙච්චර වෙලා තරහෙන් මම අල්ලගෙන හිටිය තේව්ගෙ අත මගෙන් අතෑරුනේ තේව් මට කවදාවත් කතා කරපු නැති නමකින් කතා කරපු නිසා. තේව් එහෙම කතා කරද්දි ලොකු දුකක් හිතට දැනුනා. මේ වෙනකන් තේව් කවදාවත් මට මගෙ නම කියල කතා කරල නෑ. මෙච්චර වෙලා කේන්තියෙන් තේව් දිහා බලාගෙන හිටිය මගෙ ඇස් දෙකට කඳුලු පිරෙද්දි තේව් කට කොනින් මට හිනා වෙලා ආපහු යන්න හැරුනා. ඒත් ආපහු එයා නැවතුනේ මන් කතා කරපු නිසා.

"තේව්.... ප්ලීස් කාල යන්න....."

"මට බඩගිනි නෑ....."

"ඒ වුණාට නිශා අම්මි පව්.... ඔයා කන්න එනකන් බලාගෙන ඉන්නවා...."

තේව් මේ කරන වැඩ නිසා නිශා අම්මි තවත් අවුල් යනව කියල දන්න නිසා තේව්ව කොහොමහරි නවත්තගන්න මට

ඕන වුණා......

"අනේ........ "

"මේ සුද්දී..... කැවනම් බිව්වනම් වාතයක් නොවී ඉන්නවකෝ..... මත් ගැන හොයල මට වාතයක වෙන්න එපා... මට ඕන තැන මට ඕන වෙලාවට මම යනවා....."

තේව් මගෙ දිහා බලාගෙන එහෙම කිව්වේ ඇස් දෙකත් රතු කරගෙන.... හැමදම එයා එක්ක එකට එක කියන මගෙ අද කට වැහිලා.... ඒ වචන වලට කවදාවත් නැතුව ඇස් වලට කඳුලු ඇවිත්..... තේව්ගෙ නපුරුකම් ඉස්සර වගේ මට දැන් දරාගන්න බෑ..... හේතුව මටවත් හිතාගන්න බෑ.....

"මාව වදයක්නම් මාව ආපහු අපේ ගෙදර ගිහින් දන්න තේව්....."

තේව්ගෙ බැල්ම දරාගන්න බැරිම තැන මම බිම බලාගෙන කිව්වෙ මගෙ ඇස් වලින් කඳුලු වැටෙද්දි.... එතන තවත් මට ඉන්න තරම් මගෙ හිත හයිය නැති නිසා මම එතනින් යන්න හදද්දි තේව් මාව ඇදලා ගත්තා.... මම ඇදිල ගිය පාර නැවතුනේ තේව්ගෙ පපුවෙ.....

"සොරි මැණික.... අඬන්න එපා සුද්දී.... තමුසෙ දන්නව මම කැමති නෑ කියල තමුසෙ අඬනවට.... ආයෙ එහෙම

කියන්නෙ නෑ මම..... තමුසෙ මට වදයක් නෙමේ මගෙ මැණික..... කෝ ඉතින් අඬන්න එපා....."

මාව තුරුල් කරගෙන තේව් මගෙ ඔලුව අතගෑවෙ මම නලල කිස් කරන ගමන්..... මෙහෙම ඉන්න එකෙන් තේව් තවත් මට ලන් වෙයි කියල දන්නව උනත් මට තේව්ගෙ පපුවෙන් ඈත් වෙන්න හිතුනෙ නෑ...... එයාගෙ පපුවෙ ඔලුව තියාගෙන මම ඇඬුවෙ මගෙ දුක ඉවර වෙනකන්. මම අඬන එක නැවැත්තුවත් තේව්ගෙ පපුවෙන් ඈත් වෙන්න මට ලෝබ හිතුනා. ඒක වැරදියි කියල මම දන්නව උනත් ඒ පපුවෙ තිබ්බ රස්නෙන් මට ඈත් වෙන්න හිතුනෙ නෑ. බයයි මම මේ ඉන්න විදිහෙන් තේව් මන් ගැන තවත් බලාපොරොත්තු තියාගනියි කියලා. ඒත්.... ඒත් මගෙ හිත මටත් හොරෙන් තේව්ගෙ පපුවෙ රස්නෙ හොයනවා....

"මැණික..... කෝ.... බලන්න..... "

තේව් මාව ඈත් කරන්න හැදුවත් මම ආපහු ඒ පපුවටම ගුලි වුණා....

"මට මෙහෙම ටිකක් වෙලා ඉන්න දෙන්න තේව්..... ප්ලීස්...."

මම කවදාවත් මගෙන් බලාපොරොත්තු නොවුන දෙයක් මම මේ වෙලා තේව්ගෙන් ඉල්ලුවේ....

ඇයි කියන්නවත් මම දන්නෙ නෑ.... ඒත් ඒ විදිහට ඉන්න ගොඩක් ආස කරා.....

"මැණික..... ඔයාට ඇති තරම් වෙලා මෙහෙම ඉන්න..... දන්නවද.... මමත් ගොඩක් ආසයි මගෙ මැණික මෙහෙම ඉන්නවට. උඹ මගෙ පණ සුද්දී..."

"තේවි.... ඇයි මට මේ විදිහට ආදරේ කරන්නේ...... කවද ඉදන්ද ඒ....."

මම තේවිගෙන් ඇහුවෙ මෙච්චර වෙලා මම මගෙ හිතින් අහපු ප්‍රශ්නෙ. තේවිගෙන් ඈත් වෙන්න ඕන කියල මම මටම ප්‍රොමිස් වුනත් මට ඒ ප්‍රශ්නෙට තේවිගෙන් උත්තයක් ඕන වුණා. ඒ නිසාම ඒ පපුවෙ ඔලුව තියාගෙනම මම තේවිගෙන් ඇහුව ඒ මූණ දිහා බලන්නෙ නැතුව.

"ම්...... දන්නෙ නෑ සුද්දී.... කවද කොහොම ආදරයක් ඇති වුනාද දන්නෙ නෑ..... ඒ ඇයි කියන්නවත් දන්නෙ නෑ මැණික..... මගෙ අම්මට නංගිට පස්සෙ කෙල්ලෙක්ට කියල ලන් වුනේ තමුසෙට..... මම ඔයාව පරිස්සම් කරේ තාත්තෙක් දුවෙක්ව පරිස්සම් කරනව වගේ..... උඹ මගෙ පණ සුද්දී.... ඇයි ආදරේ කරේ.... කවද ඉදන්ද කියලවත් මම දන්නෙ නෑ..... මම දන්න එකම දේ ඔයා මගෙ හුස්ම ටික කියල විතරයි සුද්දී....."

"ඒ වුණාට මම ඔයාගෙ අක්ක තේව්..... මම ඔයාට වඩා වැඩිමල්....."

" මැණික මට ඒවයින් වැඩක් නෑ.... තමුසෙ මගෙ අක්කා නෙමේ.... තමුසෙ තිස්සගෙ අක්කා.... හරිද.... අනික අක්ක අක්ක කියල කිව්වට අපේ මිනාටත් වඩා උඹ පොඩි එකෙක් අපි හැමෝටම....."

තේව් ඒක කිව්වෙනම් මගෙ මූණ එයාගෙ පපුවෙන් ඈත් කරල ඒ අත් දෙකෙන් අල්ලල එයාගෙ මූණ මගෙ මූණට ලන් කරක ගමන්..... ඒ ඇස් වල තිබ්බ බැල්ම මට දරාගන්න පුලුවන් වුනේ නෑ.... ඒ නිසාම මම බිම බලාගත්තා..... ඒත් ආපහු මගෙ මූණ එයාගෙ මූණ ලඟට ලන් කරගෙන මගෙ ඇස් දෙක එයාගෙ ඇස් දෙකෙන් අල්ලගත්ත.

"කියන්න මැණික..... මම ආදරේ කරනව වගේම ඔයා මටත් ආදරේ කරනව නේද සුද්දී..... මට බොරු කියන්න එපා... මේ ඇස් වලින් මට ඒ ආදරේ පේනව මැණික කියන්නකෝ..... ඔයාගෙ තේව්ට ආදරේ කරනව නේද මැණක..... "

තේව් එහෙම ඇහුවෙ මගෙ ඇස් දිහාම බලාගෙන....ඒත් අපි දෙන්නම ගැස්සිලා ගියෙ තේව්ට පිටිපස්සෙ ඉදන් කතා කරපු කෙනා නිසා......

# 08 කොටස

"ලොකු....... "

"අම්මා....."

අපිට කතා කලේ නිශා අම්මි. පඩිපෙලේ මැද හරියෙ ඉදන් අපිට කතා කරපු නිසා අපි කතා කරපු දේ එයාට ඇහෙන්න නැතුව තියෙන්න පුලුවන් වුණත් අපි දෙන්න හිටිය විදිහ එයා දැක්ක..... ඒ නිසා මම තේව්ගෙන් ඈත් වුණා. ඒත් එයා මගෙ කරට අත දල මාව ආපහු එයා ලඟට ගත්තා.

"කොහෙද පුතේ මේ යන්න ලෑස්ති වෙලා ඉන්නෙ..... අනික ඇයි මේ සුදු දූ මෙහෙම..... ආයෙ රණ්ඩුවක්ද..... ආහ්....."

"ආහ්.... මේ මම යාලුවෙකුගෙ බර්ත්ඩේ පාර්ට් එකකට යන්න අම්මා"

"ඔයා මට කිව්වෙ නෑනේ....."

"කියන්න අමතක වුණා. සොරි......"

"එතකොට ඇයි මේ.... සුදු දූ..... රණ්ඩු වුණාද ආපහු....."

"ආහ්..... රණ්ඩුවක් නෙමේ අම්මී. අපේ සුද්දිට නිස්සව මතක් වෙලා..... මමත් දැන් පාර්ටි එකට යනව කිව්ව හින්ද සුද්දිට දුක හිතිලා. ඉතින් ඒකයි මේ.... මාව බදගෙන යන්න එපා කියල කිව්වා"

යකූ.... මේක කියන බොරු......

මන් ඇස් දෙකත් ලොකු කරගෙන තේව් දිහා බලද්දි මේ රිලා පැටිය මට ඇහැක් ගැහුවෙ නිශා අම්මිට හොරෙන්.

"ඒකනෙ පුතේ..... හොඳ පුතා වගේ අද ඉන්න. යාලුවට කියන්න එන්න වෙන්නෙ නෑ කියලා"

"ම්..... හරි අම්මා....."

"මම යනවා..... පහලට ඇවිත් කන්න පුතේ ...."

නිශා අම්මි එහෙම කියල ගියා වුණත් මගෙ හිතට හරි නෑ..... තේව් කිව්ව දේ නිශා අම්මි පිළිගත්තද නැද්ද කියලවත් මම දන්නෙ නෑ......

"මම යනවා. ඔයත් ගිහින් කන්න තේව්"

මම තේව්ට එහෙම කියල යන්න ගියෙ මගෙ රූම් එකට. ඒ වුණත් තේව් මට යන්න නොදී මගෙ අත අල්ලගත්ත.

"මම ඔයාට තවමම යන්න කිව්වෙ නෑ සුද්දී... අනික මට තවමම මගෙ ප්‍රශ්නෙට ඔයා උත්තර දුන්නෙත් නෑ.... "

"අනේ රිලා පැටියෝ.... ඔයත් එක්ක මට මෙතන ඔට්ටු වෙන්න ඕනෙ නෑ.... මට නිදි මතයි..... යන්න දෙන්න මට"

"මොකක්.... මාර නිදි මතක්නෙ සුද්දි ඒක"

එහෙම කියල තේව් මාව එයා ළඟට ඇදලා ගත්ත පාර මාව නැවතුනේ එයාගෙ පපුවට හේත්තු වෙලා. මගෙ ඉනවටේ අතක් දල තවත් එයාගෙ පපුවට මාව හේත්තු කරගෙන එක අතකින් මගෙ නිකටින් උස්සල මගෙ මූණ එයාගෙ මූණ ළඟටම ගත්තා. ඇත්තටම තේව්ගෙ ඇස් වල තිබ්බ ඒ බැල්ම මට දරාගන්න බැරිවුණා. මගෙ මුලු ඇඟම හිරි වැටිල ගියා.

"තේව්..... මට යන්න දෙන්න......"

"යන්න දෙන්න නෙමේ මැණික මම තමුසෙව අල්ලගත්තෙ... මගෙන් ඈත් වෙන්න හිතන්නවත් එපා..."

"තේව්..... පිස්සු නටන්නෙ නැතුව මට යන්න දෙනවා.... "

"තමුසෙ නිසා තමා මට පිස්සු හැදුනේ... ඉතින් ඒකට බෙහෙත් දෙන්න වෙන්නෙත් ඔයාටම තමා මැණික..."

"අනේ තේව්.... මට යන්න දෙන්න.... අනික නිශා අම්මිත් ආපහු එයි...."

මම එහෙම කියල තේව්ව මගෙ අත් දෙකෙන්ම තල්ලු කරන්න හැදුවත් තේව් නෙමේ හෙල්ලුනේ......

"මැණික..... ඇයි මට උත්තරයක් දෙන්නෙ නැත්තේ..... මගෙ ආදරේ උඹට තේරෙන්නෙ නැද්ද සුද්දී..... උඹ නැතුව මම මැරෙයි මැණික මැරෙයි..... උඹ මාව පිස්සෙක් කරලා...... කවදාවත් මාව දාල යන්න එපා මගෙ රත්තරන්....... දන්නෙ නෑ කවද මෙහෙම ආදරයක් දැනුනද කියලා..... මම දන්න එකම දේ උඹ නැතුව මට ඉන්න බෑ කියලා විතරයි...... මාව දාල යන්න හිතුණොත් මාව මරලම පලයන් මැණික.... උඹ නැති ජීවිතයක් ගැන මට හිතන්නවත් බෑ..... "

ඒ ඇස් වල කඳුලු..... මෙහෙම ආදරයක් ගැන මම හීන දැක්කත්..... කවදාවත් ඒක තේව්ගෙන් බලාපොරොත්තු වුණේ නෑ...... මගෙම මල්ලි වගේ ඉන්න තේව් මට මෙහෙම ආදරෙයි කියල හීනෙකින්වත් මම හිතල නෑ......

මගෙ ඇස් දෙක දිහාම බලාගෙන හිටිය තේව් මගෙ මූණට බර වුණේ මගෙ තොල් දිහා බලාගෙන. ඊළඟට තේව් කරන්න යන දේ මම දන්න නිසා මම තේව්ව තල්ලු කරා....

කලින් තල්ලු කරපු වෙලාවෙ තේව් මාව තව හිර කරගත්තත් මේ වෙලාවෙ තල්ලු කරද්දි තේව් මාව අතෑරියා. තේව් මාව අතෑරපු ගමන් මම දිව්වෙ මගෙ රූම් එකට.

"සුද්දී..... මට කවන්න.... නැත්තන් මම කන්නෙ නැතුව බඩගින්නෙම ඉන්නවා....."

මම යන්න කලින් තේව් මට කිව්ව දේ නිසා මම පිටිපස්ස බලල තේව්ට රවලම තමා රූම් එකට ගියේ....

මම රූම් එකට ඇවිත් කල්පනා කරේ තේව්ගෙ වැඩ ගැන. මගෙ රණ්ඩු කෙක්ක මට මෙච්චර ආදරේ කරනවද කියල හිතාගන්න බෑ....

රිලා පැටියෝ..... තමුසෙ නිසා දැන් මට පිස්සු හැදෙනව අප්පා.... මට ඔහොම ආදරේ කරන්න එපා දෙවියනේ.... මම කොහොමද ඔයාගෙ ආදරේ පිළිගන්නෙ...... අනේ.... මට මොකද කරන්නේ කියල හිතා ගන්න බෑ..... මට ඔයාගෙන් ඈත් වෙන්න ලෝබයි තේව්..... ඒත් ඔයාට ළං වෙන්න මම බයයි. අප්පච්චි.... නිශා අම්මි..... මල්ලි..... එයාල මොනව කියයිද දෙවියනේ...... අනික මම ඔයාගෙ අක්ක තේව්..... ඒත්.... මට ඔයාගෙ ආදරේ එපා කියන්න තරම් හිත හදාගන්න බෑ..... ඔහොම මට ආදරේ කරනව කියල දැනගෙන කොහොමද මම ඒ ආදරේ එපා කියන්නේ.

මගෙ මල්ලිගෙන් පස්සෙ මත් ගැන තේරුම් ගත්ත මාව දන්න එකම කෙනා ඔයා විතරයි. මම බලාපොරොත්තු වෙන හීන දකින ආදරේ දෙන්න ඔයාට පුලුවන්. ඒත් ඒ ආදරේ අයිති කරගන්න තරම් මම පින් කරල නෑ තේව්..... ඔයාට ලන් වෙලා බලාපොරොත්තු දීල ඔයාගෙන් ඈත් වෙලා මට තව පව් පුරවගන්න බෑ..... ඒ නිසා මම ඔයාට ලන් වෙන්නෙ නෑ තේව්.... ඔයා මගෙ මල්ලි විදිහටම ඉදී.....

"සුද්දී....."

මම රූම් එකට වෙලා තේව් ගැන කල්පනා කර කර ඉද්දි දෙරට තට්ටු කරේ තේව්...

මේ රිලා පැටිය මට ඈත් වෙන්න දෙන්නෙම නෑනෙ දෙවියනේ..... දෙර අරින්නෙ නැතුව ඉන්න ඕනා.... එතකොටවත් යයිනේ.....

"මම කිව්ව සුද්දී.... මට කැව්වෙ නැත්තන් මම කන්නෙ නෑ... බඩගින්නෙම ඉන්නවා... හරිද....."

ර්ර්ර්..... රිලවෝ...... ඇයි මට මෙහෙම කරන්නේ........ මේ රිලවගෙන් බේරිල්ලක් නෑ.....

එහෙමයි කියල මම දෙර ඇරියෙත් නෑ. මම දෙර ඇරියෙ නෑ කියල තේව් දෙරට ගහන එක නැවැත්තුවෙත් නෑ.

"සුද්දී.... මට බඩගිනී..... එනවකෝ..... දන්නවනේ.... මම කිව්වොත් කිව්වා....."

තේව් ගැන දන්න නිසාම මම ගිහින් දොර ඇරියා....

"යමු....."

මම එහෙම කියල ඉස්සර වෙද්දි තේව් ඇවිත් මගෙ කරට අතක් දාගෙන පහලට ආව.... මම ඒ අත කොච්චර අයින් කරත් තේව් ආයෙ ආයෙම අත මගෙ කරට දාගත්ත. කොහොමත් බේරෙන්න බෑ කියල තේරුන නිසාම මම තේව්ගෙ අත ආපහු අයින් කරන්න ගියෙ නෑ..... අපි පහලට යද්දි නිශා අම්මි කුස්සියේ..... එයා හිටියෙ ලොකු කල්පනාවක..... නිශා අම්මිව දැක්කහම මට ලොකු බයක් ආවා... එයාට මූණ දෙන්න බෑ වගේ..... තේව් මට ආදරේ කරනව කියල දන්නෙ නැති වුණත් මට නිශා අම්මිට මූණ දෙන්න බැරි වුණා..... ඒ නිසා මම කෑමෙ මේසෙ ළගට ගිහින් තේව්ට බත් බෙදුවා... ඒ අතරෙ තේව් ගියෙ නිශා අම්මි ළඟට.

"අම්මී...... "

"අහ් පුතේ.... කෝ ආවද.... ඉන්න මන් බෙදල දෙන්නම්....."

ඇත්තටම නිශා අම්මි ඉදල තියෙන්නෙ වෙන කල්පනාවක.තේව් කතා කරද්දි නිශා අම්මි ගැස්සුනා.....

"එපා අම්මී.... ඔයා ගිහින් නිදගන්න..... සුද්දි බෙදනවා..... ඔයාට අද මහන්සිත් එක්කනේ...."

"හරි පුතේ..... ඔයා එහෙනම් කන්නකෝ..... මම ඔයා කෑවට පස්සෙ අස් කරලම නිදා ගන්නම්....."

"ඔයා නිදා ගන්න අම්මී.... මිනාට කතා කරන්නම් අස් කරන්න.... කෝ චූටි."

"චූටි දැන්නම් කොහොමත් අස් කරන්න එන්නෙ නෑ..... ඔය ඉන්නෙ ෆෝන් එක කුරුටු ගගා...."

"හරි හරි.... අපි අස් කරගන්නම්.... ඔයා ගිහින් නිදා ගන්න....."

"හරි හරි.... ඔයා කන්නකෝ...."

"ඔයා නිදගන්න ගිහින් නිශා අම්මි.... මම අස් කරන්නම් තේ්ව් කෑවට පස්සේ...."

මමත් ගිහින් නිශා අම්මිට කිව්වෙ ඇත්තටම එයාට අද ගොඩක් මහන්සි නිසා.... අද පාන්දර ඉදන්ම එයා වැඩ කරානේ.....

"සුදු දූට පූළුවනිද....."

"අයියෝ.... මම අස් කරන්නම් අනේ.... අනික අමතකද ගෙදරදි මමයි මේව තනියම කරන්නේ කියලා....."

"හරි හරි.... එහෙනම් මම යන්නම්කෝ..... "

නිශා අම්මි එහෙම කියලා මගේ ඔලුවත් අතගාල එයාගෙ රූම් එකට ගියා.... නිශා අම්මි ගියාට පස්සෙ මම තේව්ට බෙදපු බත් එකත් අරගෙන සාලෙට ඇවිත් සෝෆා එකෙන් වාඩිවුනේ තේව් මගෙ ලඟින් වාඩි වෙද්දි. එයාට කවනකන්ම තේව් කරපු එකම දේ මගෙ ඇස් දෙක දිහා බලාගෙන හිටිය එක. තේව්ට කවල මම උඩට ආවෙත් තේව් එක්කමයි. මගෙ රූම් එකට යද්දි මාව තේව් මගෙ අතින් අල්ලගෙන නැවැත්තුවා. ඒ නවත්තල එයා මගෙ නළලට කිස් එකක් දීල මගෙ ඔලුවත් අත ගාල එයාගෙ රූම් එකට ගියා.

ඔයා මාව අසරණ කරනවා තේව්.... ප්ලීස්.... මගෙ ළඟට ඔහොම ලන් වෙන්න එපා......

මම මටම කියාගෙන රූම් එකට යන තේව් දිහා බලල මම මගෙ ඇස් දෙක පියාගත්තෙ මගෙ ඇස් වලට පිරුණු කඳුලු හන්ගන්න.

# 09 කොටස

පහුවදා උදේම මම ඇහැරුනේ ගෙදර පුරුද්දට. කොහොමත් මල්ලිට ඔෆිස් අරන් යන්න කෑම හදල දෙන්නෙ මම. අදත් ඒ පුරුද්ද නිසාම ඇහැරුනේ. නිශා අම්මිත් කොහොමත් උයන නිසා වොශ් එකකුත් දාගෙන පහලට ගියෙ නිශා අම්මිට උදව් කරන්න. ඒ යද්දි නිශා අම්මි තවම ඇහැරිලා තිබ්බෙ නෑ. ඒ නිසා මම කිරි එකකුත් හදාගෙන බීල උයන්න ගත්තා. ඒ අතරතුර තමයි නිශා අම්මි ආවෙ.

"අනේ සුදු දූ..... ඔයා උයන්නත් අරගත්තද මැණික.... මට ටිකක් නින්ද ගියා"

"ඔව් නිශා අම්මී... කොහොමත් ඉතින් ගෙදරදිත් මම මල්ලිට උයනවනේ..."

"ඒ වුනාට පුතේ.... අප්පච්චි දන්නවනම් මට විසුමක් නෑ.... එයාගෙ සුදු දූවගෙන් වැඩ ගත්ත කියලා"

"ගනත් ගත්ත එපා අනේ...... ඔයාගෙ හස්බන්ඩව මම ශේප් කරගන්නම්"

"අනේ මන්ද මේ කෙල්ලනම්......"

"අද ඔයාගෙ කිචන් එක ඔයාගෙ සුදු දූ වටලල

තියෙන්නේ..... ඒ නිසා ඔයාට අද ලිව් මිසිස් නිශා......"

"හා හා.... ඕන එකක් කරගන්නකෝ...... මන් ගිහින් අර ඔයාගෙ රීලා පැටියව ඇහැරවල එන්නම්"

"හාකෝ......"

නිශා අම්මි ගිහින් තේව්ව ඇහැරවල ආවා. ඒ ඇවිත් මට උයන්න උදව් වුණ නිසා ඉක්මනින් උයාගන්න පුලුවන් වුනා. කොහොමත් මට ඉක්මනින් උයල ඉවර කරල තේව්ට පේන්නෙ නැති වෙන්න මගෙ රූම් එකට යන්න ඕන වුනා. මොකද තේව්ව මග අරින්න ඕන නිසා. හිතුව වගේම තේව් පහළට එන්න කලින් මම මගෙ රූම් එකට ගියා.

ටිකකින් තේව් මගෙ රූම් එකේ දොරට ගහනව ඇහුණත් මම දොර අරින්නෙ නැතුව බාත් රූම් එකට ගියා. බාත් රූම් එකෙන් එළියට එද්දිනම් සද්දයක් බද්දයක් තිබ්බෙ නෑ. ඒ වුණාට ඉතින් අවදානමක් ගන්න ඕනෙ නැති නිසා මම බැල්කනි එකට ගිහින් බැලුවෙ තේව්ගෙ කාර් එක තියෙනවද කියලා. එතකොට තමා දැක්කෙ තේව්ගෙ කාර් එක ගේට් එකෙන් එළියට දානවා.

අම්මෝ.... ඇතියන්නම් යක් පැටිය ගියා.

තේව් ගිය නිසා මම රූම් එකෙන් එලියට ඇවිත් Tv එක දගෙන බල බලා ඉන්නකොට මිනත් ඇවිත් මගෙ ළඟින් වාඩි වුණා.

"අහ්..... නැනෝ.... ගුඩ් මෝනින්....."

මිනා ඒ කිව්ව දේ නිසා මම ඇස් දෙකත් හීනි කරල මිනා දිහා බැලුවෙ මොකද්ද ඒ නෑන කතාව කියලා.... කෙල්ලට මගෙ බැල්ම තේරිලා වගේ දත් තිස් දෙකම එලියට දල විරිත්තුව.

"විරිත්තන්නේ.... මම කොහොමද ඔයාගෙ නෑන වෙන්නේ මිනා..... ඔව්ව නිශා අම්මිට ඇහැන්න කියනව එහෙම නෙමේ..... හරිද....."

මිනාගෙ කනකුත් අල්ලල මම එහෙම කිව්වෙ නිශා අම්මි ළඟ පාතක ඉන්නවද කියල බලන ගමන්.

"බයවෙන්න එපා නෑනෝ..... අම්මි අයිය එක්ක ගියා. එයාට මොකද්ද වැඩක් තියෙනව කියලා"

"නිශා අම්මි මට කිව්වෙත් නෑනේ..... "

ඇත්තටම මට දුක හිතුනා. මම මේ ගෙදර ඉද්දි නිශා අම්මි මට කියන්නෙ නැතුව කොහෙවත් යන්නෙ නෑ. මට කියලම තමා යන්නේ.

ඒත් එයා මට අද නොකිය ගිහිල්ලා. ඇත්තටම මට දුක හිතුනා....

"මොකෝ සුදු අක්කි මේ සෑඩ් මූඩ්.... අම්මි ඔයාට කියන්නෙ නැතුව ගිය හින්ද නේද.... ඒ පිස්සියෙ අම්මි කොච්චර ඔයෑගෙ රූම් එකේ දොරට ගැහුවද..... ඒ මදිවට ඒක ලොක්..... මොකද අනේ දොර ලොක් කරගෙන කරන්නේ... ඔයාව කවුරුත් උස්සගෙන යන්නෙ නෑ අක්කී....."

අහ් ඒ කියන්නෙ තේව් නෙමේ දොරට ගහල තියෙන්නේ.... නිශා අම්මි.......... ඒ කියන්නෙ තේව් නිකමටවත් මට කියන්න ආවෙ නෑ යනව කියල කියන්න.... ඒකත් එහෙමද රිලා පැටියෝ..... ඒත් මට මොකද එයා කොහෙ ගියත් මට වැඩක් තියෙනවයෑ... එයා ගියත් එකයි නැතත් එකයි... කේම් තමුසෙට පිස්සුද මන්ද...

"ඒ.... මොන ලෝකෙද සුදු අක්කි හිටියේ ..... "

අයියෝ..... මටනම් පිස්සු.... මේ ලෝකෙට වරෙන් කේම්යෝ.....

"අහ්.... නෑ මිනා....... මේ..... එතකොට අර රිලා පැටිය නෙමේද දොරට ගැහුවේ.... මන් හිතුවෙ එයා කියලා..... ඒ කියන්නෙ මාව ගණන් නොගෙන ගිහින් නේද....."

මිනාගෙන් මම එහෙම අහල මිනාගෙ මූණ බැලුවට පස්සේ තමා මට තේරුනේ කියන්න ඕනෙ නැති කතාවක් මම කියල තියෙන්නෙ කියලා. කොහෙද ඉතින් මගෙ කටටත් බ්‍රේක් කියල කඳුලක් නෑනේ. දැන් ඉතින් මේ මැන්ටලේගෙන් බේරෙනව බොරු. මන් දිහා බලාගෙන ඉන්න විදිහ.... නිකන් මම හොර වැඩක් කරල මාට්ටු වුන වගේ..... ඇයි අප්පා.....

"ඒ කියන්නේ......... සුදු අක්කිට දුකයි නේද....... අයිය ඔයාට කියන්නෙ නැතුව ගිය එකට"

මිනා ඒක ඇදල පද්දල නලවල කියපු විදිහටම මට වලක් කපාගෙන වැලලෙන්න හිතුනා. ඒත් ඉතින් මම මොකටද එහෙම කරන්නේ..... මට කියල තමා ඒ රිලා පැටිය යන්න ඕනා. මම එයාගෙත් අක්කනේ..... ඇයි යකූ.....

"නැතුව..... දුකයි තමා...... මම එයාගෙ අක්කා.... ඇයි එයාට බැරි මට කියල යන්න....."

මම එහෙම කිව්වෙ මගෙ හිතේ නැති දෙයක් මිනා එයාගෙ හිතින් මවාගෙන මන් ගැන වැරදියට හිතයි කියලා.....

"ඇත්තට සුදු අක්කී..... ඔහොම යමුකෝ...... ඔයා කාට බොරු කරත් මටයි සුදු අයියටයි ඔයාගෙ රිලා පැටියටයි බොරු කරන්න බෑ..... අපි ඔයාව හොඳටම දන්නව සුදු අක්කී..... "

"අනේ..... පිස්සුද මිනා.... මේ ඔච්ච නිශා අම්මි ඉන්න තැන කියනව එහෙම නෙමේ....."

මම මිනාගෙ ඔළුවට තට්ටුවකුත් දල ආවෙ එලියට...... ඒ එද්දිම මිනා කියපු දේට මගෙ යටි හිත උඩ පැන පැන නැටුවෙ නෑ කිව්වොත් ඒක පට්ටපල් බොරුවක්....

"මේ.... ඔයාගෙ රිලා පැටියත් ඔයාව හොයාගෙන ආව හොඳේ......"

මම එලියට ඇවිත් එලියෙ තිබ්බ ගල් බැංකුවෙන් ඉඳගෙන කල්පනා කරේ මේ වෙනකන් වෙච්ච දේවල්..... පොඩි කාලෙ අපි හිටිය විදිහ..... අම්මියි තාත්තියි අපිව දල ගිය විදිහ..... එතකොට තේව් මට ආදරේ කරනව කියල දැනගත්ත විදිහ...... තේව්ගෙ ආදරේ මතක් වෙද්දිනම් මගෙ පපුවත් එක්ක හිරවෙනවා........ මෙච්චර මාව පරිස්සම් කරන්නෙ මාව එයාට වටින හින්ද නේද........ මම මගෙ හිතින්ම ඇහුවෙ ඇත්තටම මමත් තේව්ට ආදරේ කරනවද කියලා..... මම කොච්චර කිව්වත් මම තේව්ට ආදරේ කරන්නෙ නෑ කියලා..... ඒත් ඒක මගෙ යටි හිත පිළිගන්න කැමති ම නෑ.......

ඒත් මම ඒ ආදරේට ආදරේ කරන්න ගිහින් නිශා අම්මිගෙයි අප්පච්චිගෙයි මල්ලිගෙයි හිත් රිද්දන්න වෙනවා.... ඒක කොහොමත් කරන්න බෑ..... ඒ නිසා මගෙ හිතේ ඔයා

ගැන ආදරයක් ඇති වුනත් මට ඒක ඔයාගෙන් හන්ගන්න වෙනවා තේව්.... ඒ ඔයාලගෙම හොදට......

මගෙ හිතේ තේව් ගැන ආදරයක් ඇති වුනත් ඒක පෙන්නන්නෙ නැතුව ඉන්න හිතාගත්තේ හැමෝගෙම හොදට....

රෑටත් නිශා අම්මිට උයන්න උදව් වෙලා මම කලින්ම රෑටත් කාල මගෙ රූම් එකට ආවෙ තේව්ව මග අරින්න ඕන නිසා..... කොහොමත් අද තේව් එන්න රෑ වෙනව කියල නිශා අම්මි කිව්වා.... මොකද අප්පච්චියි මල්ලියි දෙන්නම නැති නිසා තේව්ලගෙ බිස්නස් ගැන විතරක් නෙමේ... අපේ ඒව ගැනත් තේව් තමා බලන්නෙ.

============================

හෙට අප්පච්චියි මල්ලියි එනවා..... මේ සතියම මම තේව්ව පුලුවන් තරම් මග ඇරියා.... කොහොමත් ඒක ලේසි වුනා.... මොකද තේව් ගෙදර එද්දි මේ ටිකේම රෑ වෙන නිසා.... මිනත් මේ ටිකේ මැනේජ්මන්ට් කෝස් එකක් කරන නිසා ගෙදර හිටියෙ නෑ.... නිශා අම්මියි මමයි විතරයි හිටියේ..... මටත් තේව් එක්ක ඔෆිස් එකට යන්න කියල නිශා අම්මි කිව්වට මම ඒකට අකමැති වුනේ මට තේව්ව මග අරින්න ඕන නිසා.

කොච්චර මග අරින්න හැදුවත් මට ඒක කරන්න අමාරුයි. ඒත් ඒක කරන්නම වෙනවා. අද උදෙත් වෙනද වගේම තේව්ගෙ කාර් එක ගේට් එකෙන් එලියට ගියාට පස්සෙ තමා මම මගෙ රූම් එකෙන් එලියට ආවෙ.

දවල් වරුව නිශා අම්මිත් එක්ක පොඩි ඕපයක් කියව කියව ඉද්දි තේව්ගෙ කාර් එක ඇවිත් නැවැත්තුවා.

අයියෝ.... අද මේ රිලා පැටිය මොකද කලින්.... මෙතනින් නැගිටල යන්නත් බෑ. නිශා අම්මි මොනව හිතයිද.... කමන්නෑ.... මම තනියම නෙමේනේ...... නිශා අම්මිත් ඉන්නවනේ.....

මම බලාගෙන හිටියෙ මමයි නිශා අම්මියි ඉන්න තැනට එන තේව් දිහා..... සතියක් එක ගෙදර ඉදල දවස් ගානක් මම තේව්ව දැක්කෙ නෑ..... දැක්කෙ නෑ නේමේ ඉතින්..... මම මග ඇරියනේ.......

මේ රිලා පැටිය තවත් ලස්සන වෙලාද මන්ද දැකපු නැති දවස් ගානට.... බලන් ඉන්න ආසාවෙ බෑ..... මාර හැන්ඩියනේ..... අපොයි කේම්යෝ.... දැක්ක නේද ඒ රිලා පැටිය දිහා බලන් ඉන්නව කියලා....... ලැජ්ජාවෙ බෑ..... දැන් ඉතින් කරන්න දෙයකුත් නෑ.... වෙච්ච ලැජ්ජාව දපන් බාල්දියකට.... බොට හොඳම වැඩේ.....

මම මටම බැන බැන ඉන්නකොට තේවි ඇවිත් මගෙ ළඟින් ඉදගෙන මගෙ කරට අතකුත් දගත්තා. ඉස්සර එහෙම කරත් දැන්නම් තේවි මෙහෙම ළඟට එනකොට මොකද්දෙ ලැජ්ජාවක් එනවා. මටත් පිස්සුනෙ ඉතින්.....

"මොකෝ අම්මි මේ කුමාරිකාව අද එළියට බැහැලා"

තේවි එහෙම ඇහුවෙ මගෙ කනකුත් අල්ලන ගමන්....

දැන්නම් ඉතින් වස නෝන්ඩිය කේම්යෝ....

"අනේ පුතා..... කෙල්ලට විහිලු නොකර ඉන්නවා. ඒක නෙමේ.... ඔයා කලින් එනව කිව්වට මෙච්චර කලින් එයි කියල හිතුවෙ නෑ මම"

හෑ...... ඒ කියන්නෙ නිශා අම්මි දන්නවද මේ රිලව අද කලින් ගෙදර එනව කියලා.... අයියෝ.... නිශා අම්මි කලින් කියන්න තිබ්බනේ....

මම හිතුව විතරයි. කටින්නම් කියන්න ගියෙ නෑ. ඔච්ච කියවන්න ගිහින් මොන මොන ඒව කියයිද දන්නෙ නෑ මම.

"හ්ම්...... එන්න හිතුන අම්මා..... ඉතින් ආවා.... අනේ මගෙ සුදු අම්මි මට රසම රස තේ එක්ක හදල දෙන්නකෝ....."

"ඉන්න නිශා අම්මි..... මන් හදල දෙන්නම්...."

තේව් නිශා අම්මිට කිව්වත් තේ එකක් හදල දෙන්න කියල මම හදන්නම් කිව්වෙ එහෙමවත් එතනින් පැන ගන්න ඕන නිසා. ඒත් ඉතින් ඒක එහෙම ලේසියෙන් වෙන්නෙ නැති වැඩක්.

"නෑ .... නෑ.... මට අම්මි හදන තේ එක්ක බොන්න ඕනා..... තමුසෙ හදන ඒව එපා......"

"හරි හරි.... දෙන්න දැන් ඕකටත් රණ්ඩු නොවී ඉන්න. මම දෙන්නටම හදාගෙන එන්නම්"

මමත් ඉදන් ඉන්න තැනින් නැගිටල ගේ ඇතුලට යන නිශා අම්මි පස්සෙන් යන්න හැදුවත් මට යන්න වුනේ නැත්තෙ තේව් මාව ආපහු ඉන්දවගත්ත නිසා.....

"තමුසෙට යන්න කිව්වෙ නෑනෙ සුද්දී....."

"ඒ වුනාට මට යන්න ඕනනේ....."

මම එහෙම කියල තේව්ට රවල මගෙ අත එයාගෙ අතින් ගලවගන්න හැදුවට මට බැරි වුනා.....

"සුද්දී..... හොඳට ඉන්න මාව යකෙක් කරගන්න එපා. තමුසෙ දන්නව මට කේන්ති ගියහම කොයි වගේද කියලා"

තේව් එහෙම කිව්වහම නම් මගෙ හිත ටිකක් විතර ගැස්සුනා. මොකද මේ රිලවට තරහ ගියහම ඉතින් මෙතන තොවිල් නටවනේ. ආයෙ මොකටද මම අවදානමක් ගන්නෙ ඒ හින්ද ඉතින් මාත් එහෙම්මම හිටියා....

"මගෙ හොඳ මැණික"

එහෙම කියල තේව් මගෙ කම්මුලට කිස් එකක් දුන්නා.

ඕකනෙ ඉතින් බැරී.... එහෙත් ඉඹින්නයි මෙහෙත් ඉඹින්නයි එනවනේ....

"මේ තේව්..... මාව කිස් කරන්න එපා ඔහොම.... මන් කැමති නෑ...... "

"ඇත්තට මැණික.... ඒ වුණාට මම කැමතිනේ...... මගෙ සුදු මැණිකව කිස් කරන්න"

එහෙම කියල ආයෙත් මාව කිස් කරා...

"තේව්..... දැන් එක සැරයක් කිව්ව මම....."

තේව්ට එහෙම කියල රවල මම අහක බලාගත්තා.

ඒත් එක්කම තේව් බංකුවෙ නිදාගෙන මගෙ ඔඩොක්කුවෙන් ඔලුව තියාගෙන ඇස් දෙක පියාගත්ත......

"සුද්දී..... පුලුවන්ද මගෙ ඔලුව අතගාන්න..... රිදෙනව මැණික......"

තේව් කියන පරක්කුවට මගෙ අත තේව්ගෙ ඔලුවට ගියා. ඒත් එක්කම තේව් ඇස් දෙක පියාගෙනම හිනා වෙලා මගෙ අනිත් අත අරගෙන එයාගෙ තොල් වල තියාගත්තා. ඇත්තටම මට ලෝබ හිතුන එයා කරන දේ නවත්තන්න. මේ හිනාව මම තේව්ගෙන් දකින්න ආසම හිනාව.... මෙච්චර දවසක් මම මේ හිනාව මග ඇරිය නේද කියල මතක් වෙද්දි පුදුම තරම් දුකක් හිතුනේ....

"මැණික.... ඇයි මාව මග ඇරියේ..... මාව ඒ තරම් මගෙ මැණිකට වදයක් වුනාද සුද්දී...... ඒ තරම්ම අප්පිරිය වුණාද මාව..... ආයෙ එහෙම මග අරින්න එපා මගෙ මැණික.... ඔයාගෙ තේව් මැරෙයි..... දන්නවද එකම ගෙදර ඉදල මේ දවස් ගානට ඔයාව නොදැක මම කොච්චර විදෙව්වද කියලා..... ආයෙ එහෙම කරන්න එපා රත්තරන්..... ප්ලීස්.... මට පේන මානෙ ඉන්න..... මගෙන් ඔයාව හන්ගන්න එපා......"

මගෙ මූණ දිහාම බලාගෙන කියවන තේව්ගෙ ඇස්වල කඳුලු...... හිත පුදුම විදිහට රිදුන ඒ ඇස් වල කඳුලු දැකලා.....

එහෙම කරේ ඔයාගෙ හොඳටයි තේව්..... ඒක ඔයා තේරුම් ගනී..... ඒත් ඔයා ඔහොම අඬනව බලාගෙන ඉන්න බෑ තේව්..... මාව අසරණ කරා..... මේ හිතේ දැන් ඔයා ගැන තියෙන හැඟීම ආදරේද කියන්න මම දන්නෙ නෑ තේව්.......... ඒකට කියන්නේ ආදරේනම් මාත් ඔයාට ආදරේ කරනව තේව්..... ගොඩාක් ආදරේ කරනවා.........

ඒ වචන මගෙ හදවතින් පිටවුනත් මගෙ කටින් පිටකරන්න තරම් මට ශක්තියක් තිබ්බෙ නෑ........ තේව්ගෙ මූණ දිහාම බලාගෙන ඉන්නව ඇරෙන්න මට වෙන කරන්න දේකුත් නෑ....

ඒත් එක්කම නිශා අම්මි කතා කරපු නිසා අපි දෙන්නම නැගිට්ටෙ ගේ ඇතලට යන්න..... නිශා අම්මි කතා කරල ගේ ඇතුලට යනවත් එක්කම තේව් මාව එයා ළඟට ඇදල අරගෙන මගෙ තොල් වලට බර වුණා..... කොච්චර ඈත් කරන්න හැදුවත් මේ මට තේව් ළන් වෙන විදිහට මට තේව්ව ඈත් කරන්න හිත හදගන්න බැරි වුණා.....

# 10 කොටස

ටික වෙලාවක් මගෙ ලිප්ස් කිස් කරපු තේව් මාව ඇතෑරපු ගමන් මම ගියෙ නිශා අම්මි ළඟට. නිශා අම්මි හදපු තේ එකත් බීල නිශා අම්මිත් එකක් කිවත් එකට වෙලාම හිටිය. මට මගෙ රූම් එකට යන්න හිත දුන්නෙත් නෑ. තේව්ගෙ ඇස් තිබ්බෙ මගෙ ළඟමයි.

"හෙට අප්පච්චිලව ගන්න යන්න ඕන නේද ලොකූ..."

"ඔව් අම්මි..... සුද්දි තමුසෙත් එනවද යන්න"

තේව් මගෙන් අහද්දි නිශා අම්මිත් මගෙ දිහා බැලුව අප්පච්චිලව එක්කන් එන්න මටත් යන්න ආසයි. ඒත් මම තේව් එක්ක තනි වෙන්න බයයි. මොකද තේව් එක්ක තනියම ඉද්දි එයා මට ළන් වෙන එක මට නවත්තනන් පුලුවන් කමක් නෑ. ඒ නිසාම මම අකමැත්තෙන් වුණත් බෑ කිව්වා.

"ඔයා ගිහින් එක්කන් එන්න "

මම එහෙම කිව්වට පස්සෙ තේව් වෙන මූකුත්ම නොකිය එළියට ගියා.

රෑ කෑම කාල රූම් එකට යනකම්ම තේව්ගෙ වැඩි කතාවක් තිබ්බෙ නෑ. නිශා අම්මිත් එහෙම තමයි. දෙන්නම හරි වෙනස්. ඒත් ඉතින් මිනානම් විකාර වැඩ කර කර පිස්සු කතා කියව කියව හිනා වෙවී හිටියා. සාලෙ ටිකක් වෙලා ඉදල මම රූම් එකට ගියෙ නිදා ගන්න.

පහුවදා උදේම නැගිටල පහලට ඇවිත් නිශා අම්මිට කෑම හදන්න උදව් කරා. තේව් අප්පච්චිලව එක්කන් එන්න ගිහින් තිබ්බෙ මිනා එක්ක. ඒකත් හොඳයි. තනියම නෙමේනේ.... නිශා අම්මියි මමයි උයල ඉවර වෙලා සාලෙට එද්දිම තේව්ගෙ කාර් එක ආවා.

"නිශා අම්මී..... අන්න අප්පච්චිල ආවා"

"ඒක තමා පුතේ....."

නිශා අම්මිත් එක්ක මමත් එළියට ගියා.

"මල්ලී......."

මම ගිය ගමන්ම බදාගත්තෙ මල්ලිව.... ඊට පස්සේ අප්පච්චිව......

"ජයේ...... "

නිශා අම්මිත් ඇවිත් අප්පච්චිගෙ අතේ තිබ්බ බෑග් එක අරගත්තා. මමත් මල්ලි අතේ තිබ්බ බෑග් එක අරගෙන එයාගෙ අතේ එල්ලුනා.

"හරි මහන්සි නිශා..... අපි මොනවහරි බොමුද"

"යමුකො ගේ ඇතුලට...... මම හදන්නම්....."

අපි ඔක්කොම ගේ ඇතුළට ගියා. මිනා අප්පච්චි එක්ක හුරතල් වෙන්න ගත්තෙ එයාට ගෙනාව ඒව මොනවද කියල බලන්න. මන් මිනාටත් හිනා වෙලා නිශා අම්මිත් එක්ක ගියෙ බොන්න මොනවහරි හදන්න. බීමත් හදාගෙන ආපහු සාලෙට ඇවිත් හැමෝටම බීම දීල නිශා අම්මි යි මමයිත් සෝෆා එකෙන් ඉදගත්තා.

"මට හැමෝටම දෙයක් කියන්න තියෙනවා "

අප්පච්චි බීම උගුරක් බීලා ඉවර වෙලා කියද්දි අපි හැමෝම අප්පච්චි දිහා බැලුවා.

"හැමෝටම කිව්වට සුදු පුතානම් මේ වෙනකොටත් දන්නවා. අපේ ලොකුටත් ඔයා කියන්න ඇති නේද පුතේ....."

අප්පච්චි අපේ මල්ලිට එහෙම කියද්දි අපි හැමෝම මල්ලි දිහා බැලුවෙ එයා හිනා වෙද්දී.

"නෑ අප්පච්චී...... මම තේවිට කිව්වෙ නෑ. ඒක ඇවිත්ම කියන්න කියල හිටියේ. දැන් අප්පච්චිම කියන්න"

තේව් මල්ලි දිහා බැලුවෙ මොකද්ද කියල ඇස් දෙකෙන් අහලා. මල්ලිත් හිනා වෙලා අප්පච්චිට පෙන්නද්දි අපිත් අප්පච්චි දිහා බැලුවා. එයා මත් දිහා හිනා වෙලා බලල මට කතා කරේ එයා ළඟට එන්න කියලා.

"සුදු දූ එන්නකෝ පුතේ...... "

අප්පච්චි කතා කරාට පස්සෙ මමත් ගිහින් අප්පච්චි ළඟින් වාඩිවුණා.

"මොකද්ද ජයේ.... කියන්නකො අනේ.... අගේ නොකර"

"මේකයි නිශා...... අපි ගිය වැඩේට අමතරව තව හොඳ වැඩක් වුණා. අපේ මේ සුදු දූවට මනමාලයෙක් හම්බවුණා..."

අප්පච්චි එහෙම කියද්දි මට ඉබේම බැලුනෙ තේව් දිහා..... ඒ මූණ වෙනස් වෙන්න වැඩිවෙලා ගියෙ නෑ....... ඇස් වල කඳුලු..... මගෙ ඔලුව උඩ කලු ගලක් අතැරියා වගේ බරක් ආවේ..... මල්ලිගෙ මූණෙ හිනාවක්..... ඒත් ඒ හිනාව යට දුකක් තියෙනව කියල මට නිකමට වගේ හිතුනා. මිනා.... එයා බය වෙලා.... එතකොට නිශා අම්මි..... එයාගෙ

මූණේ තියෙන හැඟීම මට කොහොමවත් තේරුම් ගන්න බෑ....... දුකද්ද සතුටක්ද..... හිතාගන්න බෑ..... ඒ මූණේ තියෙන දේ...... මට ආපහු බැලුනේ තේව් දිහා..... ඒ ඇස් දෙකේ වේදනාව..... මට මහ බරක්.... එයා මූණට හිනාවක් අරන් මගෙ ළඟට ඇවිත් මගෙ ළඟ බිම දණ ගහගෙන එයාගෙ අත් දෙකෙන් මගෙ කම්මුල් දෙක මිරිකුවෙ ඇස් වල කඳුලු පුරවගෙන.....

"ඒ කියන්නෙ අප්පච්චී.... අපේ සුද්දි මනමාලියක් වෙලා අපිව දාල යන්න කාලෙ ඇවිත් කියල නේද......"

තේව් මගෙ දිහා බලාගෙන ඇහුවෙ අප්පච්චිගෙන්. එයාට හිනා වෙලා එහෙම ඇහුවත් ඒ ඇස් වල තිබ්බ වේදනාව මට අඳුරගන්න පුළුවන් වුණා. මවාගත්ත හිනාවක් මූණේ තිබ්බත් ඒ ඇස් වලින් කිව්වෙ මාව දාල යන්න එපා කියලා.

"අපේ කෙල්ල කැමතිනම් විතරයි...... "

අප්පච්චි එහෙම කිව්වෙ මගෙ ඔළුව අතගාලා...

"කවුද අප්පච්චි අපේ සුද්දි ලබා ගන්න තරම් වාසනාවන්තයා....."

තේව් අහන්නෙ තවමත් මගෙ ළඟ බිම දණ ගහගෙන මගෙ අත් දෙකෙන් අල්ලගෙන....

එයාගෙ වචන මගෙ පපුවට බර වැඩී.... මම දන්නවා..... එයා කොච්චර වේදිකාවකින්ද ඉන්නෙ කියන්න.....

"එදා ඔයාගෙ බර්ත්ඩේ පාර්ටි එකට ඇවිත් හිටිය මගෙ යාලුවෙක් සුනද්ද කියලා.... එයත් අපි එක්ක සිංගප්පූර් ගියා. ඉතින් එදා පාර්ටි එකට එයාගෙ පුතත් ඇවිත් අපේ කෙල්ලව දැකලා. සුනද්දට කියලා.... කොල්ලගේ නම රජිත්..... සුනද්ද මගෙනුයි සුදු පුතාගෙනුයි සුදු දූ ගැන ඇහුවා. අපි ඉතින් කිව්වා අපේ අකමැත්තක් නෑ.... දූව කැමතිනම් කියලා..... හෙට වුණත් එයාල එන්න ලැහැස්ති අපේ කෙල්ලව බලන්න.... සුදු දූ මොකද කියන්නේ....."

අප්පච්චි මුල් ටික තේව්ට කියලා අන්තිමට මගෙ දිහා බැලුවෙ මගෙ උත්තරේ මොකද්ද කියල අහන බැල්මෙන්..... හැමෝම මගෙ දිහා බලාගෙන හිටියෙ මගෙ උත්තරේ බලාපොරොත්තුවෙන්...... මම බැලුවෙ මගෙ අත් දෙක අල්ලගෙන ඉන්න තේව්ගෙ අත් දෙක දිහා..... මට ඕන වුණෙත් තේව්ව මගෙන් ඈත් කරන්න..... ඒකට අවස්ථාවක් තමා මේ ඇවිත් තියෙන්නේ...... කොහොමත් අප්පච්චිල මට කොච්චර ආදරේ වුණත් මාව ලේලි විදිහට බාරගන්නෙ නෑ කියල මම දන්නවා. ඉතින් හොඳම දේ තේව්ට ළන් වෙලා රිද්දනවට වඩා එයාගෙන් මේ විදිහට ඈත් වෙන එක. ගොඩාක් දුකයි. ඒත් හොඳම දේ මම මේ මැරේජ් එකට කැමති වෙන එක.

මට සමාවෙන්න තේව්.... ඔයාල හැමෝගෙම හොඳට මම මේ තීරණේ ගන්නේ. ඔයාට ළන් වෙලා මේ හැමෝම දුක් විදිනව බලන්න තරම් මගෙ හිත හයිය නෑ. ඔයාට ටික දවසකින් මේ ආදරේ අමතක වෙයි තේව්. ඔව් ඒ හින්ද මන් මැරේජ් එකට කැමති වෙනවා.

මම ලොකු හුස්මක් අරගෙන අප්පච්චි දිහා බැලුවෙ එක සැරයක් තේව් දිහා බලලා...

"මම කැමති අප්පච්චී. එයාලට හෙට එන්න කියන්න. මම දන්නවා අප්පච්චි මල්ලිටයි මට කවදාවත් වැරදි දෙයක් කරන්නෙ නෑ කියලා"

මම එහෙම කිව්වහම අප්පච්චිගෙ මූණෙ ලස්සන හිනාවක් ඇඳුනා. මල්ලිත් හිනා වුණා. ඒත් එයාගෙ ඇස් තිබ්බෙ මගෙ අත් අල්ලගෙන ඉන්න තේව් ළඟ. ඒත් මිනා....... එයා තවත් බය වෙලා. නිශා අම්මි.... එයාගෙ බැල්ම මට තවත් තේරුම් ගන්න බෑ..... එතකොට තේව්..... ඇස් වල කඳුලු පුරවන් හිනා වෙලා මගෙ දිහා බලාගෙන ඉන්නවා. මට තවත් තේව්ගෙ මූණ දිහා බලාගෙන ඉන්න පුලුවන් කමක් තිබ්බෙ නෑ. ඒ නිසාම මම බැලුවෙ මගෙ අත් දෙක අල්ලගෙන ඉන්න එයාගෙ අත් දෙක දිහා. ටික වෙලාවක් මගෙ අත් දෙක අල්ලගෙන හිටිය තේව් එතනින් නැගිටල මගෙ නළලට කිස් එකක් දීල එළියට ගියා. මගෙ මුළු ඇඟටම පණ නැතුව ගියා වගේ දැණුනා. මට ඇත්තටම දැන් කෑ ගහල අඬන්න ඕන වුණා.

තේව් ගියාට පස්සෙ මම මගෙ රූම් එකට ගියෙ අනිත් හැමෝම සාලෙ ඉද්දි. මගෙ රූම් එකට ගිහින් මම ඇති වෙන්න ඇඬුවා. කෑම කන්න විතරක් එළියට ආව මම ඒ එක වෙලාවකවත් තේව්ව දැක්කෙ නෑ.

පහුවදා උදේම මාව ඇහැරෙව්වෙ තිශා අම්මි.... එයාගෙ මූණෙ තියෙන්නෙ ඊයෙ තිබ්බ හැඟීමමයි. වැඩි කතාවක් නෑ. මමත් එහෙම්මයි.... කාත් එක්කවත් කතා කරන්න තරම් මට හිත නිදහස් නෑ. අපේ ගෙදර යවන්නෙ නැතුව අප්පච්චි මෙහෙම ඉන්න කිව්වෙ රගීත්ලටත් මේ ගෙදරට එන්න කියලා. මිනාගෙ උදව්වෙන් මම සාරියත් ඇඳගෙන පොඩි මේකප් එකකුත් දාගත්තා. ඒත් මිනා මාත් එක්කවත් මන් මිනා එක්කවත් කතා කරේ නෑ. මිනාගෙ වේදනාව මට නොතේරෙනව නෙමේ. ඒත් මේක තමා ගන්න තියෙන හොඳම තීරණේ. මට අන්දවල මිනා රූම් එකෙන් එළියට යන්න හදද්දි මම මිනාගෙ අතක් අල්ලගෙන එයාව නවත්තගත්තා.

"සොරි මිනා..... මාත් එක්ක ඔහොම කතා නොකර ඉන්න එපා "

එයා නැවතුනත් මගෙ දිහා මිනා බැලුවෙ නෑ.

"ඔයාගෙ ඔය තීරණේ වෙනස් කරගන්න තව වෙලා තියෙනව සුදු අක්කී....."

එච්චරයි මිනා කිව්වෙ.... ඒ කිව්වෙත් මගෙ දිහා බලන්නෙත් නැතුව.....

ටික වෙලාවකින් නිශා අම්මි මාව සාලෙට එක්කන් ගියෙ මගෙ අතට බුලත් හෙප්පුවකුත් දීලා.

ටිකකින් මම රගීත් එක්ක එළියට ගියෙ අප්පච්චි අපි දෙන්නට කතා කරන්න කියල එළියට යන්න කියපු නිසා. දොරෙන් එළියට බහිද්දිම මට මූණට හම්බවුණේ තේව්ව... ඒ ඇස් දැක්කහම මට හැමදේම අමතක වුණා. ඒ ඇස් රතුම රතු පාටයි. මගෙ දිහා බලාගෙන ඉදල රගීත් එක්කත් හිනා වෙලා ගේ ඇතුළට ගියෙ ආපහු සැරයක් මගෙ ඇස් දිහාම බලලා. රගීත් එක්ක මම එළියට ගියත් මගෙ හිත තිබ්බෙ තේව් ළඟ. රගීත් මොනවද කියනව ඇහුනත් මට ඒව අහන්න වුවමනාවක් තිබ්බෙ නෑ. ආසාවක් තිබ්බෙත් නෑ. මට ඕන වුණේ තේව් ළඟට යන්න. මගෙ හිත කිව්වෙම තේව් ළඟට යන්න කියලා.

"බබා..... මොකද මේ.... මම කියන ඒව ඔයාට ගානක් නෑ නේද...... ම්ම්ම්....."

මම සිහියට ආවෙ රගීත් මගෙ කම්මුලෙන් අල්ලපු පාර..... මට කේන්තියක් ආවෙ ඇත්තටම..... ඒ නිසාම මම රගීත්ගෙ අත ගසල දැම්මෙ රගීත් දිහා කේන්තියෙන් බලලා.....

"සොරි බබා..... "

රගීත් මගෙන් සමාව ගත්තෙ මගෙ බැල්ම තේරුණ නිසා.

"මම කැමති නෑ රගීත් මාව මෙහෙම අල්ලනවට. මට පිරිමියෙකුට කියල ළං වුනේ මගෙ තාත්තියි... මල්ලියි... අප්පච්චියි.... තේව් විතරයි..... ආයෙ මට ළං වෙන්න පුලුවන් මාව අල්ලන්න පුලුවන් කවදහරි මගෙ හස්බන්ඩ්ට විතරයි. ඔයා තවම මගෙ හස්බන්ඩ් නෙමෙයිනේ. ඒ නිසා මම කැමති නෑ ඔයා ඔහොම මාව අල්ලනවට"

"ඕකේ කේමී...... රිලැක්ස් බබා..... අපි ඉතින් ඉක්මනට මැරි කරනවනේ.... "

"හ්ම්..... "

මම හිතේ තිබ්බ කේන්තියෙන්ම ගේ ඇතුළට ගියෙ තවත් මට රගීත් එක්ක එළියෙ ඉන්න බැරි නිසා. මට ඕන වුණේ ඉක්මනටම අපේ ගෙදර යන්න.

හොමෝම කතාබහ කරල ගියාට පස්සෙ මමත් මල්ලි එක්ක ගෙදර ආවා. ඒත් මම තේව්ව දැක්කෙ නෑ.

********************************

තේව්ිලගෙ ගෙදරින් ඇවිත් අදට සතියක්. මේ දවස් ගානටම මම තේව්ව දැක්කෙ නෑ. වෙනදට හැමදම අපේ ගෙදරට ඇවිත් මාත් එක්ක රණ්ඩු වෙන මගෙ රීලා පැටිය දැන් අපේ ගෙදර එන්නෙම නෑ. තේව්ව ඈත් කරන්න ඕන නිසා මේ මැරේජ් එකට කැමති වුණත් මට තේව්ගෙන් ඈත් වෙලා ඉන්න බෑ කියල මේ දවස් ගානට තේරුණා. මල්ලිගෙන් තේව් ගැන ඇහුවත් මල්ලි කියන්නෙ එයත් තේව්ව දැක්කෙ නෑ කියලා. ඉදල හිටලලු කතා කරන්නේ...... ඔෆිස් එකේ අලුත් ප්‍රොජෙක්ට් එක නිසා බිසී වෙලා ඉන්නෙ කියල තේව් කිව්ව කියල තමා මල්ලි කිව්වෙ.... වෙනදට හැමදම හම්බවෙන තේව් දැන් මල්ලිව මඟ අරිනවලු. දැන් දවස් තුනක් විතර කතා කරෙත් නෑ. දැක්කෙත් නෑ කියල තමා මල්ලි කියන්නෙ. කොච්චර ඈත් කරන්න හැදුවත් මට දැන් තේරෙනවා තේව්ව මට ඈත් කරන්න බෑ කියලා. මගෙ හිතේ තේව් ගැන ආදරයක් ඇති වෙලා කියල දැන් මට තේරෙනවා. ඒත් ඒක මම පිළිගන්නේ නෑ. එහෙම පිළිගත්ත් තේව්ට ළන් වෙන්න මට බෑ. ඒ නිසාම ඒ ආදරේ මගෙ ළඟ පරිස්සමට තියාගන්නවා.

"අක්කා....."

මම රූම් එකේ ඉද්දි මල්ලි කතා කරේ.....

"එන්න මල්ලි....."

මල්ලිගෙ මූණ එච්චර හොඳ නෑ. අද ගෙදර ආව වෙලේ ඉදන්.... මොකක්හරි ප්‍රශ්නයක් මූණෙන් දැක්කත් මල්ලි මට කියනකන් මම අහන්න ගියෙ නෑ. මට තේරුණ විදිහට මල්ලි දැන් ආවෙ ඒ ප්‍රශ්නෙ මාත් එක්ක කතා කරන්න.

"අක්ක..... තේව් මොකක්හරි ලොකු අවුලක ඉන්නෙ අක්කා...... ඒත් ඇහුවට කියන්නෙ නෑ. කතා කරන්නෙත් නෑ. මට මේ ටිකේ ඌව බලන්න යන්නත් බැරි වුණා. හිතට හරි අවුල් අක්කා.... ඌ කවදාවත් ඔහොම ඉදල නෑ...... "

මල්ලි එහෙම කියද්දි මගෙ මුළු ඇඟම නිකන් ගිනිගත්ත වගේ.... තේව් එහෙම දුකින් ඉන්න ලොකුම හේතුව මම කියල මම මල්ලිට කොහොම කියන්නද...... හැමෝම සතුටු කරන්න කියල මම ගත්ත තීරණේ නිසා දැන් හැමෝම දුකින් නේද ඉන්නෙ කියලත් මට දැන් හිතෙනවා. ඒත අප්පච්චිගෙ සතුට ඒක නේද.... මගෙ තාත්ති වගේ ඉන්න අප්පච්චිගෙ සතුට ඒක.... එයාගෙ හිත රිද්දන්න මට හිත හදාගන්න බෑ...... මල්ලිට මොනවද කියන්නෙ කියලවත් මට හිතා ගන්න බෑ.....

"මල්ලී....."

මම මල්ලිට කතා කරද්දිම එයාට කෝල් එකක් ආවා.....

"මිනා කතා කරන්නෙ අක්කා......"

"අරන් බලන්න..... අප්පච්චි නුවර ගියා කිව්ව නේද.... හදිස්සියක්ද දන්නෙ නෑ...... මේ රෑ ගන්නෙ...."

මල්ලි ෆෝන් එක ආන්සර් කරද්දි මගෙ හිත ගැහෙන්න ගත්තෙ තේව්ව මතක් වෙලා.... මොකද්දෝ.... අමුත්තක් දැනෙන්න ගත්තා.... මල්ලිගෙ වෙනස් වෙන මූණ දැක්කම ඒ බය තවත් වැඩි වුණා.....

"හරි හරි.... අඬන්නෙ නැතුව ඉන්නව මිනා..... අපි එන්නම්....."

ෆෝන් එක කට් කරල මල්ලි මගෙ දිහා බැලුවෙ ඇස් දෙකේ කඳුලු පුරවගෙන.....

"අනේ අක්කා.... අරූට සිහිය නෑලු......"

"මොකක්....."

මට මුකුත් හිතාගන්න බැරි වුණා..... මට ඇඬුනෙ තේව්ව මතක් වෙලා..... මට තේව් ළඟට යන්න ඕන වුණා......

"අනේ.... මල්ලි යමුකෝ.... පව් මගෙ අහිංසකයා.... දෙයියනේ.... සිහි නැති වෙලා තියෙන්නෙ ඇයි......"

"උණ හැදිලා ඉදල අක්කා..... යමුකෝ..... ගිහින් බලමු....."

තේව්ලගෙ ගෙදර යනකම්ම මම අඬපු එක කරේ. මල්ලියි මමයි අතර කිසිම කතාවක් තිබ්බෙ නෑ. මල්ලිත් සැරින් සැරේ කඳුලු පිහදනව මන් දැක්කා. තේව්ලගෙ ගෙදරට ගිය ගමන් මල්ලි දුවගෙන ගියෙ තේව්ගෙ කාමරේට. මට යන්න හම්බුනේ නෑ මල්ලි තේව්ව හරහට ඇරගෙන පහලට ආවා. ඒ එක්කම පිටිපස්සෙන් නිශා අම්මියි මිනයි ආවා.

"අක්කෙ නඟිනව ඉක්මනට කාර් එකට......"

මල්ලි කියන පරක්කුවට මම ආපහු පිටිපස්සෙන් නැග්ගට පස්සෙ මල්ලි තේව්ව පිටිපස්සෙන් තිබ්බෙ තේව්ගෙ ඔළුව මගෙ ඔඩොක්කුවෙන් තියලා.....

දෙයියනේ..... මෙච්චර රස්නයක් ඇගේ........ ඇයි දෙයියනේ තේව් ඔහොම ඉන්නෙ..... මාව පිච්චෙනව රත්තරන්..... ඇස් අරින්න.... ඔයාගෙ සුද්දි ඔයා ළඟ ඉන්නෙ......

මට කතා කරගන්වත් සිහියක් තිබ්බ නෑ...... කරපු එකම දේ තේව්ගෙ ඔළුව අත ගගා අඬපු එක...... මල්ලි තේව්ව කාර් එකට දගත්ත ගමන් පුළුවන් තරම් වේගෙන් ආව ප්‍රයිවට් හොස්පිටල් එකකට..... අරගෙන් ගිය ගමන් තේව්ව opd එක ඇතුලට ගත්තා.... මට සිහියක් පතක් තිබ්බෙ නෑ..... තේව්ව ටිකකින් රූම් එකට දැම්මෙ තව විනාඩි දහයකින් සිහිය එයි කියලා..... මල්ලි මට රූම් එකට

වෙලා ඉන්න කියල එලියට ගියේ තේව්ට සිහිය ආවට පස්සෙ දෙන්න සුප් එකක් ගෙන්න කියලා.....

මල්ලි ගියාට පස්සෙ මම තේව්ව බදාගෙන ඇඬුවෙ සැරින් සැරේ තේව්ගෙ නළල ඉඹින ගමන්.....

අනේ.... මගෙ රත්තරන්.... ඇස් අරින්නකෝ..... ඔයා ඔහොම ඉද්දි මට දරාගන්න බෑ පැටියෝ..... ඇයි ඔයා ඔහොම නොකා නොබී හිටියේ......... ඔයාට මොනවහරි වුණානම් මම මටම සමාව දෙන එකක් නෑ තේව්......

මම තේව්ව බදාගෙන ඇඬුවෙ මේ දුක මට තවත් දරාගන්න බැරි නිසා...... කොහොමද මම දරාගන්නෙ.... මමත් දැන් තේව්ට ආදරේ කරනවා...... ඒක කොච්චර හන්ගන්න හැදුවත් මම කොහොමද මගෙ තේව් මෙහෙම ඉන්නව දකිද්දි දරාගන්නෙ.....

"සුද්දී......"

මම ඔලුව ඉස්සුවෙ තේව්ගෙ කටහඬ නිසා. ඔව්..... තේව්ට සිහිය ඇවිත්.....

"තේව්......"

මම තේව්ගෙ මූණ මගෙ අත් දෙකෙන් අල්ලගෙන එයාගෙ නළලට කිස් එකක් දුන්නෙ මගෙ ඇස් දෙකෙන් කඳුලු වැටෙද්දි.

"මැණික..... අඬන්න එපා....."

තේව් අමාරුවෙන් එහෙම කිව්වෙ මගෙ අතක් අල්ලගෙන.....

"ඇයි මෙහෙම වුණේ.... ඇයි නොකා නොබී හිටියේ.... ඩොක්ටර් කිව්ව ඔයා ගොඩක් දුර්වලයි කියලා...... ඔයාට මොනවහරි වුණානම් ඔයාගෙ සුද්දි කොහොමද දරාගන්නෙ තේව්...... ඔයා මගෙ පණ.... කොහොමද මම ඔයා නැතුව ඉන්නේ...... කියන්න රත්තරන්..... මට බෑ..... ඔයා නැතුව ඉන්න.... මේ ටිකේ මම විදවපු තරම් දන්නෙ මම විතරයි.

"සුද්දී..... ඒ කියන්නෙ මැණික..... ඔයා..... "

තේව්ට කතා කරන්න නොදී මගෙ ඇඟිල්ලක් එයාගෙ තොල් උඩින් තිබ්බෙ ආපහු සැරයක් මම තේව්ගෙ නළලට කිස් එකක් දෙන ගමන්....

"ඔව් තේව්..... ඔයාගෙ මැණික ඔයාට ගොඩක් ආදරේ කරනවා.... ඒ අක්ක කෙනෙක් විදිහට නෙමේ තේව්.... ඔයා බලාපොරොත්තු වෙන ආදරේ..... ඔයාගෙ සුද්දි ළඟ තියෙනවා මගෙ රත්තරන්......"

ඔව්.... තේව්ගෙ ඇස් දිලිසෙනවා..... තේව්ගෙ සතුට ඒ ඇස් වලින් හොඳටම පේනවා..... ඒ ඇස් වල කඳුලු.... ඒ සතුට වැඩි කමට .....

"මගෙ මැණික..... ආපහු කියන්න....."

"මම ආදරෙයි මගෙ මහත්තයෝ...."

මම එහෙම කියනවත් එක්කම තේව් මාව ඇදල අරගෙන මගෙ තොල් අල්ලගත්තෙ එයාගෙ තොල් වලින්...... එයාගෙ ඇස් දෙක වගේම මගෙ ඇස් දෙකත් පියවුනේ අපි දෙන්නගෙම හිත් වල උඩු දුවන හැඟීම් වලට නිදහසේ ගලාගෙන යන්න දීලා..... ඒත්..... මම තේව්ගෙන් විසි වුණේ ඇහුණ කටහඬට......

"තේව්........."

ඒ අප්පච්චි...... රූම් එකට එනව ඇහුණෙත් නෑ..... නිශා අම්මි..... මල්ලි.... මිනා.... හැමෝම රූම් එකේ...... ඒ කාගෙවත් මූණ බලන්න පුලුවන් කමක් මට තිබ්බෙ නෑ...... ඒ නිසා මම හිටියෙ බිම බලාගෙන..... ඒත් එක්කම තේව් මගෙ අතක් අල්ලගෙන ඇඳෙන් ඉදගත්තා.....

"ලොකු පුතා.... මේක තේරුම මට කියන්න පුළුවන්ද..... "

කතා කරේ අප්පච්චී....

"සොරි අප්පච්චි...... මම සුද්දිට ආදරේ කරනවා..... සුද්දිත් එහෙමයි.... "

තේවි එහෙම කියද්දිම අප්පච්චි තේවිගෙ කම්මුලට පාරක් ගැහුවා......

"අනේ..... අප්පච්චි..... මට සමාවෙන්න. තේවිට ගහන්න එපා අප්පච්චී..... මම තේවිගෙන් ඈත් වෙන්නම්. මම හිටිය විදිහට තේවිගෙන් ඈත් වෙලා ඉන්නම්. තේවිට ගහන්න එපා අප්පච්චී....... මට සමාවෙන්න... ඔයාගෙ සුදු දූ ඔයාව රිද්දුවට සමාවෙන්න"

මම බිම ඉදගෙන අප්පච්චිගෙ කකුලක් අල්ලගෙන ඇඬුවෙ මට හිටගන්නවත් පණක් නැතුව යද්දී.... ඒත් එක්කම මිනයි නිශා අම්මියි මාව නැගිට්ටවල නිශා අම්මිගෙ ඇඟට හේත්තු කරගත්තා.....

"ලොකූ..... තමුසෙ මොකද්ද මේ කරන්නෙ ආහ්.... මේ කෙල්ල බඳින්න ඉන්න කෙල්ලක්.... තමුසෙට ඒක තේරෙන්නෙ නැද්ද.... ඇයි තමුසෙට කලින් ඕක කියන්න බැරි වුනේ.... අහ්..... මගෙ කෙල්ලට ආදරේ කරනව කියල ඇයි තමුසෙට කලින් කියන්න බැරි වුනේ..... මේ අප්පච්චි අකමැති වෙයි කියල කොහොමද තමුන් හිතුවේ..... අහ්....."

"අප්පච්චී..... "

තේව් අප්පච්චිව බදාගත්තෙත් මම අප්පච්චි දිහා බැලුවත් එක පාරමයි....

දෙයියනේ..... මේ මට ඇහෙන දේවල්..... හීනයක් නෙමේ නේද දෙවියනේ..... ඒ කියන්නෙ අප්පච්චි මට කැමතිද..... දෙවියනේ කවදාවත් හිතුවෙ නෑ.....

"සුදු දූ.... මෙහෙ එන්න...... "

අප්පච්චි මාවයි තේව්වයි දෙන්නවම තුරුල් කරගත්තා.

"මගෙ කොල්ලට මේ වගේ කෙල්ලෙක් වගේම මගෙ කෙල්ලට මේ වගේ කොල්ලෙකුත් ආයෙ හම්බවෙන්නෙ නෑ. ඒ නිසා මම සුනද්දට කියල වෙඩින්ග් එක කැන්සල් කරවන්නම්. උඹල දෙන්නගෙම වයස මට ප්‍රශ්නයක් නෙමේ. ඒක ඔයාල දෙන්නට ප්‍රශ්නයක් නෙමේනම්... වැදගත් වෙන්නෙ ආදරේ විතරයි පුතේ..... "

අප්පච්චි එහෙම කියල එලියට ගියෙ අපි දෙන්නගෙම තළල ඉඹල.

"සුදු දූ......"

"නිශා අම්මී......"

"දැන් නිශා අම්මි නෙමේ...... අම්මි..... හරිද...... මගෙ කෙල්ල මගෙ ගෙදර ලේලි වෙලා එනකම් මම ගොඩක් කල් බලන් හිටිය පුතේ...... මග මේ වසවර්තිය ඔයාට ආදරේ කරනව කියලත් මට තේරිලා තිබ්බෙ...... දැන් මට ගොඩක් සතුටුයි.... මගෙ කෙල්ල දැන් මගෙ ළඟමයි....."

තේව් වගේම මමත් නිශා අම්මි දිහා බැලුවෙ නිශා අම්මි කියපු දේ හිතා ගන්න බැරුව..... මිනත් ඇවිත් මාව බදාගෙන ඉදල නිශා අම්මි එක්ක රූම් එකෙන් එලියට ගියෙ අප්පච්චිව බලල එන්නම් කියලා....

නිශා අම්මිත් ගියාට පස්සෙ මම බැලුවෙ මල්ලි දිහා..... මට මල්ලිට කතා කරන්න හිත හදාගන්න බෑ..... එයා හිටියෙ මටයි තේව්ටයි පිටුපාලා....... මාව තේව් තේරුම් ගත්ත නිසා එයා ඇස් වලින් කිව්වෙ බය වෙන්න එපා කියලා....

"මචන් නිස්සා.... සොරි බන්...... "

තේව් මල්ලිට කතා කරද්දි මල්ලි අපි දිහා බැලුවා..... අපි දෙන්න දිහා බලාගෙන හිටිය මල්ලි අපි ළඟට ආවෙ කේන්තියෙන්...... ඒ ඇවිත් තේව්ගෙ ශර්ට් එකෙන් අල්ලගෙන තේව්ගෙ මූණට මල්ලිගෙ මූණ ළන් කරේ මම මල්ලිගෙ අතේ එල්ලෙද්දි..... ඒත් මට මල්ලිව අයින් කරන්න පුලුවන් වුණේ නෑ....

"උඹේ කේන්තිය අඩු වෙනකම් මට ගහපන් තිස්සා..... ඒත් සුද්දිව මගෙන් ඈත් කරන්න එපා තිස්සා.....සුද්දි මගෙ පණ තිස්සා..... මේකි මගෙ පණ....."

තේව් කිව්වෙ ඇස් වල කඳුලු පුරවගෙන.

"ඔව්..... උඹව මැරුවත් මදි මගෙ තරහ ඉවර වෙන්න....අහ් පර බල්ලො.... මාත් එක්ක හැම රෙද්දම කියන උඹට මේ දේ විතරක් කියන්න බැරි වුනේ මේකි මගෙ අක්ක හින්දද.... කොහොමද තෝ හිතුවෙ මම උඹට මගෙ අක්කව නොදී ඉදියි කියලා..... කොහොමද උඹ හිතුවේ....කියපන්...... උඹ තරම් මස්සිනෙක් මට වෙන නෑ තේව්........උඹල දෙන්න මෙහෙම ආදරේ කරනව කියල දන්නවනම් මම කොහොමත් රගීත් කියන එකාට කැමති වෙන්නෙ නෑ..... මගෙ හිත යට උඹට අක්කව දෙන්න කැමැත්ත තිබ්බත් උඹේ හිතේ එහෙම එකක් නෑ කියල මම හිත හදාගත්තා..... උඹට කියන්න තිබ්බ තේව්.... උඹට කියන්න තිබ්බා.... එහෙනම් උඹවත් මෙන්න මේ ගොන් ගහවත් මෙහෙවත් දුක් විදින්නෙ නෑ..... උඹ තරම් මගෙ අක්කව බලාගන්න පුලුවන්.... උඹ තරම් මගෙ අක්කව දන්න උඹ තරම් ආදරේ කරන කෙනෙක් කොහොවත් නැතුව ඇති බන්....."

මල්ලි එහෙම කියල තේව්ගෙ ශර්ට් එක අතෑරල මාවයි තේව්වයි බදාගත්තෙ ඇස් වලින් වැටෙන කඳුලු අතරින් අපි තුන් දෙනාම හිනා වෙන ගමන්.....

"මම උඹට කලින් කියනව මෙන්න මේකිත් මට කලින්ම ආදරෙයි කියල කිව්වනම්....."

තේව් එහෙම කිව්වෙ මල්ලි අපි දෙන්නව අතෑරියට පස්සෙ....

"ඒ කිව්වේ....."

මල්ලි ඇහුවෙ මගෙ දිහා බලන ගමන්.....

"මේකනෙ බන්..... මෙන්න මේ පිස්සු මගුල මට ආදරෙයි කියල කියන්න මට උණ හැදිලා අමාරු වෙනකම්ම හිටියනේ....."

තේ්ව් එහෙම කියද්දි මම තේව්ට රවල අහක බලාගත්තෙ තේව් හිනා වෙද්දි....

"ඒ කියන්නෙ මේකි උඹට ආදරේ කරනව කියල කිව්වෙ දැන්ද....."

"ඒකනෙ බන්....."

"අම්මටසිරි...... ඒකත් එහෙමද..... හරි හරි.... එහෙනම් ඉතින් තව මොන මොනව හරි ඇතිනේ.... ඇරියස් එහෙම.... මම එළියට යන්නම්....."

මල්ලි එහෙම කියල ගියෙ මම තේව්ට රවද්දි....

"මොකද්ද රිලා පැටියො ඒ කිව්ව කතාව.... බලනවා..... මල්ලි මොනව හිතුවද දන්නෙ නැතෙ....."

"ඉතින් මට මොකෝ.... මොනව හිතුවත්....."

ඇඳේ ඉදගෙන හිටිය තේව් මාව ඇඳල එයාගෙ ඉස්සරහට අරගෙන එයාගෙ කකුල් දෙක අස්සෙ මාව හිර කරගත්තෙ මගෙ තොල් එයාගෙ තොල් වලින් අල්ලගන්න ගමන්..... විනාඩි ගානක් එහෙමම හිටිය තේව් මගෙ තොල් අතෑරියෙ මගෙ මූණ එයාගෙ අත් දෙකට මැදි කරගෙන.....

"උඹ අයිති මට විතරමයි මැණික......"

මගෙ මූණ දිහා බලාගෙන හිටිය තේව් එහෙම කියල මගෙ නළල කිස් කරේ හිත පුරාම තිබුණ ආදරෙන්.....

මේ තමා මගෙ ලෝකේ..... ගෙදරින් අකමැති වෙයි කියලා.... වයස ප්‍රශ්නයක් වෙයි කියල හන්ගන්න ගිය ආදරේ අද හිත පුරාම පිරිල ඉතිරිලා යනවා.... ඒ මගෙ ආදරේ බලාගෙන හිටිය තේව් නමින්ම.....

මේ තරම් ආදරයක් තවත් මට ලැබෙන්නේ නෑ.....
හැමදාටම මම තේව්ගෙ විතරමයි......

"මම ඔයාගෙ විතරමයි මගෙ රත්තරන්....."

හිත පුරාම ඉතිරිලා ගිය ආදරෙන් තේව්ව මගෙ පපුවට තුරුල් කරගත්තෙ හැමදාටම මේ ආදරේ ලබන්න ලෝබ කමින්.

~සමාප්තයි~

ආදරේට වයස බාධාවක්ද නැද්ද කියල කල්පනා කරන එක ඔයාලටම බාරයි. හිතට ආව අදහසක් අකුරු කරේ.